පුස්තකාලය
- 6 JUL 2005
තැ. පෙ. 1522
කොළඹ.

# වාර්ෂික වාර්තාව
# 2000

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07,
ශ්‍රී ලංකා.

HARTI Annual Report Sinhala,2000

- 6 JUL 2005
කොළඹ.

# 2000
# වාර්ෂික වාර්තාව

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07,
ශ්‍රී ලංකා.

# පාලක මණ්ඩලය

| | |
|---|---|
| එම්.එස්. වික්‍රමාරච්චි මහතා | - සභාපති පාලක මණ්ඩලය සහ ලේකම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය (1999.10.08 දින සිට) |
| ආචාර්ය ඇස්.ජී. සමරසිංහ | - අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (1993.12.15 දින සිට) |
| එම්.බී. ඒකනායක මහත්මිය | - නියෝජිත, මුදල්, ප්‍රතිපත්ති සැලසුම්, වාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය (1998.06.01 දින සිට) |
| සී. මාලියද්ද මහතා | - නියෝජිත, මුදල්, ප්‍රතිපත්ති සැලසුම් වාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය (1999.03.01 දින සිට) |
| මාලනී මඩුවේ ගෙදර මිය | - නියෝජිත, වාරිමාර්ග,විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (2000.12.01 දින සිට) |
| ජී.බී.එස්. ලියනගේ මහතා | - නියෝජිත, අභ්‍යන්තර හා බාහිර වෙළඳ, වාණිජ හා ආහාර අමාත්‍යාංශය (2000.12.05 දින සිට) |
| ආචාර්ය යූ. විදානපතිරණ | - නියෝජිත, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, (1999.04.05 සිට) |
| පී.ඩබ්. සෙනවිරත්න මහතා | - නියෝජිත, වෘත්තිය පුහුණු හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය, (1999.05.25 සිට) |
| ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක | - නියෝජිත, ශ්‍රී ලංකා මහ බැංකුව (2000.11.10 සිට) |
| ආචාර්ය එස්.ඩී.ජේ. ජයවර්ධන | - කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල් (1995.09.25 දින සිට) |
| එස්. පුස්සේපිටිය මහතා | - ගොවිජන සේවා කොමසාරිස් (1997.09.30 දින සිට) |
| ඩබ්.පී. ජිනදස මහතා | - වාරි මාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් (1999.11.04 දින සිට) |
| ජී.එස්.එල් පොන්සේකා මහතා | - සමුපකාර සංවර්ධන කොමසාරිස් (2000.07.18 සිට) |
| ආර්.ද සිල්වා මහත්මිය | - ලේකම් පාලක මණ්ඩලය. (1992.06.15 සිට) |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07,
2002 සැප්තැම්බර් 9.

ගරු කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යතුමා,
කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**2000 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්**

වර්ෂ 2000 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වර්ෂ 1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14(2) වගන්තියට අනුව මෙම ආයතනය සම්බන්ධව, ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් වන ලේඛන මේ සමඟ ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුම්
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණය

මෙයට - විශ්වාසී,

ඩික්සන් නීලවීර,
සභාපති,
පාලක මණ්ඩලය.

# වාර්ෂික වාර්තාව - 2000

**සමුදයාර්ථය**

1972 අංක 5 දරණ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 දී ස්ථාපනය කරන ලදී. ආරම්භයේදී එ.ජා.ස.වැ /ආ.කෘ.ස. ආධාර කළ මෙම ආයතනය වත්මනේදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. මෙම ආයතනය ආරම්භයේ සිටම ගොවිකටයුතු පිළිබඳ ගැටළු විශ්ලේෂණය කරන හා ග්‍රාම සංවර්ධනය උදෙසා මානව සම්පත් පුහුණුකරන සමාජ විද්‍යා පර්යේෂණ හා සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරමින් ග්‍රාමීය හා සුළු ගොවි කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳව කටයුතු කරමින් විවිධ අමාත්‍යාංශ රාජ්‍ය ආයතන හා ජාත්‍යන්තර ආයතනවලට සහය ලබාදීමට කටයුතු කර ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා තිල බලයෙන් සභාපතිත්වය දරණ පාලක මණ්ඩලයක් මඟින් ආයතනයේ පරිපාලන කටයුතු සිදු කෙරේ. මෙරටේ ගොවිකටයුතු ක්ෂේත්‍රයෙහි සංවර්ධනයට දායක වන මූලික රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරයාද පාලක මණ්ඩල සාමාජිකයෙකු වෙයි.

ආයතනයට බලය දෙන ලද කාර්යභාරයන්වල අරමුණු බහුවිධ වන්නේය. මෙරටේ ප්‍රධානතම පර්යේෂණ ආයතනයක් ලෙස මෙම ආයතනයෙන් බලාපොරොත්තු වන්නේ ජාතික හා අන්තර් ජාතික ආයතන මඟින් ලබා ගන්නා ගොවි කටයුතු පර්යේෂණ පෝෂණය කිරීම, ආධාර කිරීම, දිරි ගැන්වීම සහ සහයෝගිතාවය පැවැත්වීමයි. මෙරටේ ගොවිජන ප්‍රජාවට අවසානයේ දී සුභසාධනය වන ආකාරයට ආයතනය මඟින්ම පර්යේෂණ අධ්‍යයන පැවැත්වීමත් සුළු ගොවි අංශයට සම්බන්ධිත සමාජ ආර්ථික අංශ, ගොවිකටයුතු ගැටළු හා ප්‍රශ්න විමර්ශනය කිරීම ද ආයතනයෙන් අපේක්ෂා කෙරේ. උසස් මට්ටමේ කලාපීය ගොවි කටයුතු මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව හා ආසියාතු රටවල්වල සහයෝගය වර්ධනය කරමින් ගොවි කටයුතු ප්‍රශ්නවලට අදළ පර්යේෂණ පැවැත්වීම හා තොරතුරු විසුරුවා හැරීම ද මෙහි කාර්යභාරයක් වන්නේය. විවිධ සංවර්ධන ගැටළු අරඹයා ජාතික හා කලාපීය ආයතන හා ඒජන්සි විසින් සිදු කරන පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ජාතික කලාපීය හා අන්තර් ජාතික සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම හා ජාතික කලාපීය පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය ද මෙම ආයතනයේ සංවර්ධන අරමුණුවලට අයත් වේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ප්‍රාථමික සමාජ ආර්ථික පර්යේෂණ කරනු ලබන ආයතනයක් වශයෙන්, මහ පෙන්වීමක් ලබාදීම සඳහා විවිධ කෘෂිකාර්මික ගැටළු හා ප්‍රශ්න සම්බන්ධව කෙරෙන විශාල සංඛ්‍යාවක් අධ්‍යන පර්යේෂණ සඳහාත්, එමෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති වැඩ සටහන් සඳහාත්, විශේෂිත ප්‍රතිපත්ති සාදන්නන්ට උපකාරීවීම සඳහාත්, මූලික වශයෙන් පහත සඳහන් නිර්නායක මත පර්යේෂණ ක්ෂේත්‍රය හඳුනා ගැනීමේ ප්‍රතිපත්තියක් ආයතනය විසින් අනුගමනය කරනු ලැබේ.

1. ගොවිකටයුතු ක්ෂේත්‍රයේ පවතින අවශ්‍යතා පර්යේෂණ කාර්ය මණ්ඩලය මඟින්ම සොයා බලා පර්යේෂණ හා පුහුණු කිරීම් සිදු කිරීම.

2. ජනාධිපති ලේකම් කාර්යාලය, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය කාන්තා කාර්යාංශ ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සහ, සෙසු රාජ්‍ය ආයතන මඟින් කෙරෙන ඉල්ලීම් අනුව, පර්යේෂණ අධ්‍යයන, සමීක්ෂණ, වැඩමුළු ආයතනය මඟින්ම හෝ ඔවුන්ගේ සහභාගිත්වය ඇතිව පැවැත්වීම.

3. ලෝක බැංකුව, ආසියාතු සංවර්ධන බැංකුව හා ආහාර හා කෘෂිකර්ම සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනයන්හි ඉල්ලීම අනුව ඔවුන්ගේ ප්‍රතිපත්ති සැකසීම සඳහා පර්යේෂණ අවශ්‍යතා ඉටුකිරීම.

4. සෙසු ආයතනයන් හි පර්යේෂණ සහ පුහුණු කිරීම් කටයුතු ඉටුකර ගැනීම විවිධ ආයතන ඉල්ලුම් කළ විට මෙම ආයතනය මගින් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීම.

මෙම පැවරුම අනුව ලැබී ඇති පෘථුල මග පෙන්වීම අනුව ආයතනය මගින් ජනාධිපති ලේකම් කාර්යාලය කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතන සඳහා ක්ෂණික පර්යේෂණ අධ්‍යයන / සමීක්ෂණ පවත්වා ප්‍රතිපත්ති යෝජනා එම ආයතන වලට ඉදිරිපත් කරනු ලබයි. එහෙයින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා ගොවි ප්‍රජාවට ප්‍රයෝජනවත් පර්යේෂණයන්ට උපකාරීවෙමින්, පවත්වමින් ගොවිකටයුතු ක්ෂේත්‍රයෙහි සංවර්ධනයට සාධනීය දයකත්වයක් ලබාදේ.

මෙම වාර්තාවේ විස්තරාත්මකව සඳහන් වන අයුරින්, 1. කෘෂිකර්ම සැළසුම් හා අගැයීම් 2. කෘෂි සම්පත් කළමනාකරණ 3. වාරි ජලකළමනාකරණ හා ගොවි ජන සම්බන්ධතා 4. අලෙවි හා ආහාර ප්‍රතිපත්ති, 5. සංඛ්‍යාන හා දත්ත සැකසුම් 6. මානව සම්පත් සංවර්ධන හා ආයතන සංවර්ධන යන අංශ හය මගින් ආයතනයට පැවරුණු පර්යේෂණ හා පුහුණු කිරීම් පවත්වාගෙන යනු ලැබේ. ආයතනය සතු සීමිත මූල්‍ය හා මානව සම්පත් අනුව පෙර වර්ෂවලදී මෙන්ම වසර 2000 දී ද විවිධ ගොවිකටයුතු ප්‍රශ්න සම්බන්ධයෙන් පර්යේෂණ රාශියක් සිදු කර ඇත්තේය. එමෙන්ම මෙරටේ ගොවි ප්‍රජාවගේ අභිවෘද්ධියට හේතුවන සොයාගැනීම් හා ප්‍රතිපත්ති නිර්දේශයන් රාශියක් ඉදිරිපත් කිරීමට මෙම පර්යේෂණ මගින් හැකිවී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආ.කෘ.ස. සර්ඩැප් වැනි අන්තර් ජාතික කලාපීය සංවර්ධන සංවිධාන සමඟ සබඳතා ගොඩනගා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමටද ආයතනයට හැකියාව ලැබුණි. ආසියා හා පැසිපික් කලාපීය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානයේ (සර්ඩැප්) මූල්‍ය ආධාර ලබා මාතලේ, මහනුවර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල කාර්යබද්ධ පර්යේෂණ පැවැත්වීම එබඳු ඒකාබද්ධ වැඩසටහන් පිළිබඳව මනා නිදසුනක් වේ.

**පර්යේෂණ හා පුහුණු කිරීම් පිළිබඳ වැදගත් කරුණු**

පෙර වසර වලදී මෙන්ම 2000 දී ද ආයතනය මගින් විවිධ වැදගත් පර්යේෂණ හා පුහුණු කිරීම් කටයුතු මාලාවක් ගොවිකටයුතු ක්ෂේත්‍රය අරභයා පවත්වාගෙන යන ලදී. ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා ගොවි ප්‍රජාවට යන දෙඅංශයටම වැඩදායී එබඳු කටයුතු කිහිපයක් පහත සඳහන් කරනු ලැබේ.

**කෘෂි සැළසුම් හා ඇගයීම් අංශය**

මෙම වසර තුළදී වැදගත් අධ්‍යයන දෙකක් නිමකරන ලදී. ගොවි ජන බැංකුවේ ණය ක්‍රමය ඇගයීම ඉන් පළමු වැන්නයි. පහසු ණය ක්‍රමයන් මගින් ගොවීන්ට කෘෂිකාර්මික ණය සේවාවක් රජය මගින් සපයනලදී. විධිමත් ණය මාර්ගවලට අවතීර්ණ වීමට ඉඩකඩ සළසා ගත හැකි ආකාරයට සිය හැකියාවන් දියුණු කර ගැනීමට මේ මගින් ගොවීන් සෑහෙන සංඛ්‍යාවකට ඉඩකඩ ලැබී ඇති බව අධ්‍යනයෙන් අනාවරණය විය. මෙයට අමතරව ගොවිපොළ නිෂ්පාදනය හා ආදයම වර්ධනය කර ගැනීමටද මෙම ණය ක්‍රමයෙන් පහසුකම් සැළසී තිබේ. ණය ක්‍රමය දියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් අධ්‍යයනයේ පර්යේෂකයන් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ලබා දී තිබේ.

දෙවන අධ්‍යයනය වූයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ **ණය පදනම් කරගත් ස්වයං රැකියා වැඩ සටහන** ඇගයීමයි. ග්‍රාමීය කාන්තාවන්ගේ දිළිඳු භාවය තුරන් කිරීමේ සුවිශේෂ අරමුණින් ණය පදනම් කරගත් ස්වයං රැකියා වැඩ සටහන මෙමගින් දිස්ත්‍රික්ක මට්ටමින් ඇගයීමට ලක්කරන ලදී.

මෙම ස්වයං රැකියා ව්‍යාපෘතියේ රැකියා බොහෝ පවුල් වල ප්‍රධාන ආදයම් මාර්ගය බවට පත්වී ඇත. මෙයට සම්බන්ධිත කාන්තාවන්ගේ පවුල්වල ග්‍රාමීය දිළිඳුභාවය අවම කිරීම හා සමාජ ආර්ථික තත්ත්වය දියුණු කිරීම් සඳහා ප්‍රතිපත්ති නිර්දේශයන් රාශියක් පර්යේෂකයින් විසින් පෙන්වා දී තිබේ. එහෙයින් මෙම සොයාගැනීම් හා නිර්දේශයන් ආයතනය විසින් කාන්තා කාර්යාංශය වෙත ලබාදී තිබේ.

## කෘෂි සම්පත් කළමනාකරණ අංශය

දිළිඳු ජනතාව බෙහෙවින් සිටින අනුරාධපුරය වැනි වියලි කලාපයීය දිස්ත්‍රික්කයන්හි කාර්ය බද්ධ පර්යේෂණ පැවැත්වීම සඳහා කෘෂි සම්පත් කළමනාකරණ අංශය ඉමහත් අවධානයක් යොමු කළේය. අංශය ක්‍රියාත්මක කළ එවැනි එක් පර්යේෂණයක් වූයේ **අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි අඩම්පනේ සුළු ගොවීන් සඳහා කෘෂිකාර්මික යෙදවුම් ශක්තිමත් කිරීමයි.** ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ සර්ඩැප් ආයතනය මෙම පර්යේෂණයට අරමුදල් සැපයීය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කෘෂිකාර්මික සේවා හා යෙදවුම් ලබා ගැනීම පහසු කිරීම තුළින් ඔවුන්ගේ ගොවිපොළ නිෂ්පාදන තත්ත්වය හා ආදයම නංවාලීමයි. ණය යෙදවුම් හා පුහුණුව ලබාදීම තුළින් ආයතනයේ පර්යේෂකයෝ මෙම වැඩසටහනේ දී ගොවීන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූහ. සර්ඩැප් නිලධාරීන් විසින් කරන ලද ඇගයීමක් අනුව මෙම ව්‍යාපෘතිය මඟින් ගොවිජනතාවගේ සංවර්ධන සහභාගිත්වය වර්ධනය කරන අතරම යෙදවුම් හා සේවා යන්ත්‍රණයට ඔවුන්ගේ සමීපභාවයද දියුණු කර ඇත.

**කෘෂිකර්ම ව්‍යාප්තිය වාණිජකරණය කිරීම ; හැකියාවන් හා සංරෝධක හඳුනාගැනීම,** මෙම අංශයේ පර්යේෂකයන් විසින් ඉටුකරන ලද තවත් වැදගත් අධ්‍යයනයකි. මෙරටේ වැවිලි නොවන කෘෂිකාර්මික අංශයේ ව්‍යාප්ති සේවා පෞද්ගලීකරණ හැකියාවන් විමසා බැලීමට මෙම අධ්‍යයනයෙන් උත්සාහ දරා ඇත. කෘෂිකාර්මික තොරතුරුවල ආර්ථික ස්වභාවය, ගොවි ප්‍රජාව පිළිබඳව පෞද්ගලික අංශයේ ඇති නිෂේධනීය ආකල්ප, සීමිත ආර්ථික වාසි, රාජ්‍ය අංශයෙන් දිරිගැන්වීමක් නොලැබීම හා පෞද්ගලීකරණ සංකල්පයට ගොවි ජනතාව තුළ ඇති විරෝධය වැනි කරුණු නිසා පෞද්ගලික අංශය ව්‍යාප්ති කටයුතු වල නියැලීමට බාධාවක් වී ඇති බව අධ්‍යයනයෙන් හෙළිවිය. මෙම අධ්‍යයන වාර්තාවෙන් ලැබුන තොරතුරු අනුව වැවිලි නොවන අංශ මඟින් කෘෂිකාර්මික අංශයේ පෞද්ගලික ව්‍යාප්තිසේවා කටයුතු වල නිරතවීම අහිතකර තත්ත්වයක පවතී.

## අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය

ජාතික ආහාර සුරක්ෂිත කමිටුවට අලෙවි තොරතුරු ලබාදීම හා වෙළඳ අමාත්‍යාංශයට ආධාර කිරීම තුළින් අගනා මෙහෙවරක් සිදුකර ඇත. එයට අමතරව සතිපතා මාසික ආහාර ද්‍රව්‍ය විවරණිකාව මඟින් වෙළඳ ද්‍රව්‍ය තොරතුරු, රජයට, වෙළඳුනට හා නිෂ්පාදකයන් (ගොවියන)ට ලබාදීමද සිදු කෙරේ. විවිධ අමාත්‍යාංශවල ඉල්ලීම අනුව ගොවිකටයුතු ක්ෂෙත්‍රයෙහි ප්‍රශ්න අරභයා ක්ෂණික සමීක්ෂණ පැවැත්වීමද මෙම අංශයේ පර්යේෂකයෝ සිදු කරති. නිදසුනක් ලෙස මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීමක් මත වී තොග පිළිබඳව ක්ෂණික සමීක්ෂණයක් මෙම අංශය මඟින් සිදු කර ඇත. මෙමඟින් ගොවි ප්‍රජාවගේ යහපත උදෙසා වී මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ නව රටාවක් ද හඳුන්වා දෙනු ලැබීය. අන්තර් ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව ජාතික පෝෂණ ආයෝජන සැළැස්මක් සකස් කිරීමද මෙම අංශය මඟින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ පෝෂණ සම්බන්ධතා අනාගත ආයෝජන අංශ ඇගයීම මෙම සමීක්ෂණයේ අරමුණු විය.

**ආචාර්ය ඇස්.ජී. සමරසිංහ,**
**අධ්‍යක්ෂ,**

**2001 මාර්තු 30,**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු,**
**පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**
**කොළඹ 07.**

## පාලක මණ්ඩලය (වසර තුළදී සිදුවූ වෙනස්කම්)

මෙම වසර තුළදී පාලක මණ්ඩල සංයුතියේ පහත සඳහන් වෙනස්වීම් සිදුවිය.

වාරිමාර්ග විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයා ලෙස පාලක මණ්ඩලයට පත් වූ ජේ.ඒ.එස්.එස්. ගුණවර්ධන මහත්මියගේ සාමාජිකත්වය එම අමාත්‍යාංශයේ ඉවත්වීමත් සමඟ අවසන් විය.

මාලනී මඩුවේ ගෙදර මහත්මිය වාරිමාර්ග විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිත ලෙස පාලකමණ්ඩලයට පත්විය. (2000.12.01 සිට)

විශ්‍රාම ගැනීමත් සමඟ ලලිත් හීන්ගම මහතාගේ සාමාජිකත්වය අවසන්විය.

දේශීය හා අන්තර්ජාතික වෙළඳ හා වානිජ අමාත්‍යාංශය නියෝජනය කරමින් ජී.බී.එච්. ලියනගේ මහතා පාලක මණ්ඩලයට නැවත පත්විය. (2000.12.05 සිට)

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් ඒ.එම්. චන්ද්‍රපාල මහතා පාලක මණ්ඩලයට පත්විය. (2000.02.11 සිට)

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය පාලක මණ්ඩලයට පත්විය. (2000.11.10) සිට

සේවා කාලය අවසන්වීමත් සමඟ පී.ටී. ප්‍රතිරාජ මහතාගේ සාමාජිකත්වය අවසන් විය. (2000.05.01 සිට)

ඉඩම් කොමසාරිස් ධූරයෙන් ඉවත්වීමත් සමඟ එස්.බී. බැද්දවෙල මහතා ගේ පාලක මණ්ඩල සාමාජිකත්වය 1999.11.25 වැනි දින අවසන් විය.

සමූපකාර කොමසාරිස් ධූරයෙන් සමුගැනීමත් සමඟ පී.ඒ. රත්වත්තේ මහතාගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් වූ අතර ඔහුගේ අනුප්‍රාප්තික ජී.එස්.එල්. ෆොන්සේකා මහතා එම තනතුරට 2000.07.18 දින සිට පත්විය.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නියෝජිත සුරේෂ් ආර්. ශර්මා මහතා 2000.01.13 සිට 2000.11.23 දක්වා පාලක මණ්ඩලය සාමාජිකත්වය දැරීය.

එම සංවිධානයේ නියෝජිත මස්ලාන් ජුසෝ මහතා 2000.11.23 සිට පාලක මණ්ඩලයට පත්විය.

## කාර්ය මණ්ඩලය සංවර්ධනය

**පශ්චාත් උපාධි වැඩ සටහන**

පහත සඳහන් පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයනයන්හි යෙදී සිටියහ.

| | | |
|---|---|---|
| එම්.එස්. ගෞරි සංකර් මහතා | - | ජපානයේ කෝබේ විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය |
| ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය | - | ජර්මනියේ ග්ලැසන් විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය |
| පී.ඩී.ජේ. ආනන්ද මහතා | - | ඕස්ට්‍රේලියාවේ ලාට්‍රොබ් විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික මිනිස්බල ආයතනයේ මානව කෘෂි සම්පත් හා ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය |

ප.පු.නි. ආචාර්ය පී.අයි. තුඩාවේ මිය පෙබරවාරි 07 සිට 11 දින දක්වා ඉන්දුනීසියාවේදී පැවැති ආහාර අනාරක්ෂිතතාවය, අප්‍රමාණිකත්වය පිළිබඳ තොරතුරු හා සැළසුම් පද්ධති පිළිබඳ අන්තර් ආයතන ක්‍රියාකාරී කමිටු රැස්වීමට සහභාගි වූවාය.

ප.පු.නි. ආචාර්ය පී.අයි. තුඩාවේ මිය තායිලන්තයේ බැංකොක් නුවර පෙබරවාරි 23-25 දක්වා පැවැති සුළු ණය හා සමාජ සජීවිකරණය මඟින් කාන්තා ස්වයං ආධාර කණ්ඩායම් බලවත් කිරීමේ හා හැකියාවන් වර්ධනය කිරීමේ වැඩමුළුවට සහභාගි වූවාය.

වා.ගො.ස. අංශයේ ප්‍රධාන ආර්. ද එස්. ආරියබන්දු මහතා දශවන ජල සමුළුවට මාර්තු 12-16 දක්වා ඕස්ට්‍රේලියාවේ දී සහභාගි විය.

ආයතන අධ්‍යක්ෂ ආචාර්ය එස්.ජී. සමරසිංහ මහතා මාර්තු 10 සිට 19 දින දක්වා බංග්ලාදේශයේ පැවැති සර්ඩැප් රැස්වීමට හා තායිලන්තයේ පැවැති කෘෂිකාර්මික අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ උපදේශක රැස්වීමට සහභාගි විය.

ප.පු.නි. අයි.ආර්. පෙරේරා මහතා ජපානයේ දී අප්‍රේල් 17 සිට 22 දක්වා පැවැති ඒකාබද්ධ ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධන සමුළුවට සහභාගි විය.

අධ්‍යක්ෂ ආචාර්ය එස්.ජී. සමරසිංහ හා පුහුණු අංශයේ ප්‍රධාන ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා හයිද්‍රාබාද්හි ග්‍රාම සංවර්ධනය පිළිබඳ දකුණු ආසියානු කලාපීය වැඩමුළුවට අප්‍රේල් 25 සිට 27 දක්වා සහභාගි වූහ.

ප.පු.නි. එස්.එම්.ඒ. සමරකෝන් මහතා අගෝස්තු 14 සිට 17 දක්වා පිලිපීනයේ පැවැති ඒකාබද්ධ ප්‍රජා සංවර්ධනය පිළිබඳ පුහුණුකරුවන්ගේ වැඩමුළුවට සහභාගි විය.

වා.ගො.ස. ප්‍රධාන ආර්.ද.එස්. ආරියබන්දු මහතා අගෝස්තු 14 සිට 19 දක්වා ස්වීඩනයේ පැවති 10 වන ස්ටොක්හෝම් ජල සමුළුවට සහභාගි විය.

අලෙවි අර්ථශාස්ත්‍රඥ එල්.පී. රූපසේන මහතා ඉන්දුනීසියාවේ ජකර්තා නුවර ඔක්තෝබර් 2 සිට 6 දක්වා පැවැති ග්‍රාමීය දිළිඳු ජනතාව වෙත යටිතල පහසුකම් දියුණු කිරීම මඟින් වන සමාජ ආර්ථික බලපෑම පිළිබඳ වැඩ මුළුවට සහභාගිවිය.

සංවර්ධන සමාජ විද්‍යාඥ ආචාර්ය ඩී. ගමගේ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා ක්‍රියාත්මක කිරීමේ දේශපාලනය පිළිබඳ වැඩමුළුවට ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 10 දින දක්වා ඉන්දියාවේදී සහභාගි විය.

අධ්‍යක්ෂ ආචාර්ය එස්.ජී. සමරසිංහ, නොවැම්බර් 4 සිට 12 දක්වා පිලිපීනයේ පැවැති සර්ඩැප් තාක්ෂණ කමිටු රැස්වීමට සහභාගිවිය. ඔහු එහි සභාපතිවරයා ලෙස ඒකමතිකත්වයෙන් පත්කර ගන්නා ලදී.

ප.පු.නි. එම්.එම්.එම්. අහියර් මහතා නොවැම්බර් 5 සිට 9 දක්වා බංග්ලාදේශයේ පැවැති ජල සනීපාරක්ෂාව හා නිරෝගිභාවය පිළිබඳ සමුළුවට සහභාගි විය.

# කාර්ය මණ්ඩල තත්ත්වය

**වසර තුළදී ආයතනයේ කාර්ය මණ්ඩලයේ තත්ත්වය පහත සඳහන් වේ.**

| | 1999.12.31 දිනට තත්ත්වය | වසරතුළදී නතර කිරීම් ඉල්ලා අස්වීම් | පත්කිරීම් | 2000.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්‍ෂ | 01 | - | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (පර්යේෂණ) | 01 | 01 | 01 | 01 |
| අංශ ප්‍රධානීන් | 06 | - | - | 06 |
| පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීන් | 26 | 06 | - | 20 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 05 | - | 01 | 06 |
| පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 02 | | | 02 |
| දත්ත සංවර්ධන ඒකකය, | 02 | | | 02 |
| පරිගනක ඒකකය | 01 | | | 01 |
| ප්‍රකාශන ඒකකය | 04 | - | - | 04 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 25 | 03 | | 22 |
| තාක්‍ෂණික කාර්ය මණ්ඩලය | 03 | - | - | 03 |
| ලිපිකාර, ලේකම් හා සමාන්තර ශ්‍රේණි | 47 | - | 01 | 48 |
| මෙහෙයුම් හා සම්බන්ධිත ශ්‍රේණි | 38 | 02 | - | 36 |
| | 161 | 12 | 03 | 152 |

# කෘෂිකාර්මික සැලසුම් හා ඇගයීම් අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ්.ජී. ජයසේන | - | අංශ ප්‍රධාන |
| එස්.ආර්. බණ්ඩාර මිය | - | ප.පු.නි. |
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | ප.පු.නි. |
| එම්.එස්. ශ්‍රී ගෞරි සංකර් මහතා | - | ප.පු.නි. |
| ආර්.එල්.එන්.. ජයතිස්ස මහතා | - | ප.පු.නි. |
| එන්.එන්.ඒ. ද සිල්වා මහතා | - | සංඛ්‍යාන නිලධාරී |

## නිම කළ අධ්‍යයන

1. **ගොවි බැංකු මගින් ලබාදුන් ගොවි ණයවල කාර්ය සාධනය විමර්ශන කිරීම.**

පර්යේෂකයෝ : ආචාර්ය ඩබ්.ජී. ජයසේන
එම්.එස්. ශ්‍රී ගෞරි සංකර් මහතා
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

අධ්‍යයන ප්‍රදේශ : එලයාපත්තුව, බිංගිරිය, වලවෙළ, රත්තොට, ගලේවෙල,කිඹිස්ස, දඹුල්ල, බෙලිඅත්ත, වීරවිල යන කෘෂි සේවා මධ්‍යස්ථාන ප්‍රදේශ

මෙම අධ්‍යයනය මගින් මෑතදී ගොවිජන බැංකු මගින් ක්‍රියාත්මක කළ පුළුල් ගොවි ණය වැඩ සටහනේ කාර්ය සාධනය ඇගැයීමට ලක් කර ඇත. මෙමගින් විශේෂ අවධානය යොමුකර ඇත්තේ ණය වැඩ පිළිවෙලෙහි මතුවූ ගැටළු හා සංරෝධක හඳුනා ගැනීමට හා එමගින් මෙම වැඩ පිළිවෙළ තවදුරටත් වැඩි දියුණු කිරීමට ක්‍රම සහ මාර්ග හඳුනා ගැනීම සඳහාය.

**ප්‍රතිපත්ති නිර්දේශ**

i. පවතින ඉල්ලුම සපිරෙන ලෙස කෘෂි ණය වැඩ සටහන පුළුල් කිරීම සඳහා බොහෝ ගොවි ජනබැංකු මුහුණ දෙන සංරෝධකයක් නම් බීජ මිලදී ගැනීමට අරමුදල් ප්‍රමාණවත් නොවීමයි. එහෙයින් මෙම ප්‍රශ්නය විසඳීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාරකාර අරමුදලින් ණය මුදල් ගොවිජන බැංකුවලට සැපයිය යුතුවේ.

ii. ගොවිජන බැංකුවල පවතින ශ්‍රමික හිඟය මඟ හැරීම සඳහා ණය පාලනය/ලිපිකාර කටයුතු සඳහා ප්‍රාදේශීය නිලධාරිවරයාගේ සුපරීක්ෂාව යටතේ අධ්‍යාපන සුදුසුකම් සහිත ගොවි නියාමකවරුන් කෙනෙකු හෝ දෙදෙනකු පත්කළ යුතුවේ. මෙම වැදගත් කර්තව්‍ය ඉටුකිරීම සඳහා එය ගොවිනියාමකයන්ගේ රාජකාරි ලැයිස්තුවට ඇතුළත් කළ යුතුය.

iii. විශේෂයෙන් ගොවිජන බැංකුවල ණය සම්බන්ධිත ගිණුම් හා ලෙජර් පොත් සම්බන්ධ කටයුතුවල නිරතවන ගොවිජන කේන්ද්‍රවල ලිපිකරුවන්ට හා ගොවි නියාමකයන්ට ප්‍රමාණවත් පුහුණු පහසුකම් සැළසිය යුතුය.

iv. මෙම ණය ක්‍රමය යටතේ බාල වර්ගයේ බීජ ද්‍රව්‍ය ලබාදීම නිසා සමහර ගොවි කණ්ඩායම්වල වගා පාළු වීමට හේතු වී ඇති නිසා ඵලදායිතාවය වර්ධනය කිරීම හා අස්වැන්න අඩුවීම අවම කිරීම

සඳහා වී සහතික කිරීමට ගොවිජන බැංකු ණය ආධාර ක්‍රමය යටතේ විශේෂයෙන් බිත්තර වී හා වෙනත් බීජ වැනි ඉහළ මට්ටමේ යෙදවුම් සැපයීම අවශ්‍ය වේ.

v. අනපේක්ෂිත කාලගුණ තත්ත්වයන් හෝ අලෙවි ගැටළු නිසා ගොවීන්ට ආදායම් ප්‍රශ්න ඇති වුවහොත් ඔවුන්ට ණය ආපසු ගෙවීමට නොහැකිවීම වැළක්වීමට මෙම ණය ක්‍රමය වගා රක්ෂණ ක්‍රමය සමඟ සම්බන්ධ කළ යුතුය.

vi. ගොවීන්ගේ යහපත සඳහා ඔවුන් විසින්ම ගොවිජන බැංකුව පිහිටුවා ගත් බවට සාධනීය හැඟීම් ඔවුන් තුළ ජනිත කරවනු පිණිස ගොවි ජන බැංකුව අදාළ ගොවිජන කේන්ද්‍රයෙහි වෙනම අංශයක් ලෙස පවත්වාගෙන යායුතුය.

vii. කාර්යශීලී හා ඵලදායක ආකාරයට ගොවීන්ට ආයෝජනය කළ හැකිවන පරිදි ණය මුදල් නිසිකලට ලබාදීමේ කටයුතු කඩිනම් කළ යුතුය. මේ සඳහා දිස්ත්‍රික් මට්ටමේ අධිකාරීන්ට හා ප්‍රාදේශීය නිලධාරීන්ට මූලධන අරමුදල් නිසිකළට සැපයීම සහතිකවීම අත්‍යාවශ්‍ය වේ.

viii. (වී අතුරුභෝග හා වෙනත් වාණිජ භෝග ආදී) ගොවීන්ගේ වෙළෙඳ ද්‍රව්‍ය විකුණා ගැනීමේ පහසුකම් සැපයීම සඳහා අලෙවි පහසුකම් සැපයීමට ගොවිජන බැංකු අරමුදල් උපයෝගි කර ගත යුතුය. ඒ සඳහා ඔවුන්ට අයත් සංවිධාන වන ගොවිජන කේන්ද්‍ර, ගොවි සංවිධාන හා ගොවි සමාගම් යොදගත හැකිය. කලට වේලාවට ණය ආපසු අයකර ගැනීමට හා ණය ක්‍රමයේ රඳ පැවැත්මට එබඳු ක්‍රමයක් මඟින් සහතික කෙරෙනු ඇත. කෙසේ වෙතත් ප්‍රාදේශීය මට්ටමේ එබඳු අලෙවි රටාවක් සාර්ථක කරගැනීමට ගොවි ජනතාව මුල්කරගත් ජාතික අලෙවි ප්‍රතිපත්තියක් බිහිකිරීම අවශ්‍ය වේ.

ix. ගොවීන්ගේ නිෂ්පාදනයන් වන වී හා අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා වන වර්තමාන නිෂ්පාදන වියදම් සැසඳීමේදී ගොවිජන බැංකු මඟින් ගොවීන්ට ලබාදෙන සත්‍ය ණය පරිමාව අතිශයින් සුළු නිසා එමඟින් නිෂ්පාදන පිරිවැය පියවා ගැනීම අපහසුය. එහෙයින් ගොවීන්ට මෙම ණය ක්‍රමය යටතේ ලබාදෙන ණය මඟින් නිෂ්පාදන වියදමින් සැළකිය යුතු කොටසක් හෝ ආවරණය කිරීමට හැකි විය යුත්තේය.

x. පසුගිය වගා කන්න කිහිපයක දී ගොවිජන බැංකු ණය ක්‍රමය යටතේ ගොවීන්ට ලබාදුන් ණය ආපසු ගෙවීමට නොහැකි වී ඇත්තේ ගොවිපොළේදී ලැබෙන අවම මිල හා ගොවීන්ගේ අප්‍රමාණවත් ආදායම නිසාවෙනි. ගොවීන්ට ගොවිපළේදී සාධාරණ මිලක් හා ඉහළ ආදායමක් ලබාගනු පිණිස ආරක්ෂිත ආනයනය පිළිවෙතක් හා ප්‍රධාන භෝග වගා ප්‍රදේශවල තරඟකාරී අලෙවි රටාවක් හඳුන්වා දීම තුළින් අලෙවි පහසුකම් ශක්තිමත් කිරීමට රජය මැදිහත් විය යුතුය. ණය ගෙවීම් පැහැර හරින්නන්ට නියමිත කලට ණය ආපසු ගෙවීමට උනන්දුකරවීම හා ගොවිජන බැංකු ණය ක්‍රමය තිරසාර ලෙස ක්‍රියාත්මකවීම එබඳු ආදායම් වර්ධනයක් මඟින් සිදුවනු ඇත.

## 2. චක්‍රීය අරමුදල් පදනම් කරගත් කාන්තා ස්වයං රැකියා වැඩසටහන ඇගයීම.

පර්යේෂක : ආචාර්ය ඩබ්.ජී. ජයසේන

අධ්‍යයන ප්‍රදේශ : බදුල්ල, කළුතර, කෑගල්ල, මහනුවර, කුරුණෑගල, පොළොන්නරුව, අනුරාධපුරය, මොණරාගල, පුත්තලම හා ගම්පහ දිස්ත්‍රික්ක

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ ඉල්ලීමක් අනුව මෙම අධ්‍යයනය ආයතනය මඟින් භාරගන්නා ලදී.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ කාන්තා කාර්යාංශය මගින් හඳුන්වා දෙනු ලැබූ චක්‍රීය අරමුදල් පදනම් කරගත් ස්වයං රැකියා ණය ව්‍යාපෘතියෙහි බලපෑම ඇගයීම හා එය ක්‍රියාත්මක කිරීමට හා කළමනාකරණය කිරීමට බලපාන බාධක හා සංරෝධක හඳුනා ගැනීමය. මූලික සොයාගැනීම් පදනම් කරගෙන අතුරු වාර්තාවක් කාන්තා කාර්යංශය වෙත භාර දී ඇත.

## මූලික සොයාගැනීම්

සමීක්ෂණයේ සොයා ගැනීම් අනුව චක්‍රීය අරමුදලේ ආධාරයෙන් ස්වයං රැකියා ආරම්භකළ කාන්තාවන්ගෙන් බහුතරය (86.5% ක්) එම කටයුතු දිගටම පවත්වා ගෙන යන අතර සුළු කොටසක් විවිධ හේතුමත එම කටයුතු අතර මග නවතා ඇත. කාන්තාවන්ගෙන් 60% ක් මෙම අරමුදල යොදවා ඇත්තේ තමන් විසින් මුල සිට පවත්වාගෙන ආ කටයුතුවලට බවද අනාවරණය විය. මෙම ණය මුදල් ලබාගෙන නව ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇත්තේ කාන්තාවන්ගෙන් 40% ක් බවද හෙළිවිය. ප්‍රතිලාභී කාන්තාවන්ට ස්වයං රැකියා මගින් අමතර ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකිවූ බවද, එමගින් සිය කුටුම්භයේ ආදායමට 40%ක් දායක වීමට ඔවුන්ට හැකිවූ බවද සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වී ඇත. මෙය මෙම ණය ක්‍රමයේ යහපත් ප්‍රතිඵලයක් ලෙස සැළකිය හැකිය. ග්‍රාමීය ප්‍රදේශවල විරැකියාවෙන් හා සුළු රැකියාවල යෙදෙන කාන්තාවන්ට රැකියා උත්පාදනය කිරීමට මෙම ණය ක්‍රමයට හැකිවී ඇති බවද තවදුරටත් පෙන්වා දිය හැකිය.

## ප්‍රතිපත්ති නිර්දේශ

i. විවිධ හේතූන් නිසා චක්‍රීය අරමුදල පදනම් කරගත් ස්වයං රැකියා වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බොහෝ ස.කො. (සැළසුම්) වරුන්ට නොහැකිවී ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය විය. අදළ ප්‍රදේශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම සඳහා කාන්තා කාර්යාංශයට සෘජුව සම්බන්ධ දිස්ත්‍රික්ක මට්ටමේ නිලධාරීන් පත්කළ යුතුය. එයට අමතරව ස්වයංරැකියා වැඩ පිළිවෙල පිළිබඳව ප්‍රගති සමාලෝචන සුපරීක්ෂණ හා උපදේශාත්මක වගකීම් ද ඔවුන්ට පැවරිය යුතුය. කෙසේ වෙතත් එක් දිස්ත්‍රික්කයක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ රැසක ක්‍රියාත්මක වන ස්වයං රැකියා වැඩසටහන් ආවරණය කිරීමට එක් නිලධාරියෙකුට කළ නොහැකි වන්නේය. දීර්ඝකාලීන වශයෙන් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම කාන්තා කාර්යාංශයේ නිලධාරියෙකු පත්කළ යුතු වන්නේය. එබඳු නිළධාරීන් පත් කිරීම තුළින් ස්වයං රැකියා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අමතරව වනිතා කටයුතු වර්ධනය කිරීමට එම නිලධාරීන්ගේ සේවය යොදගත හැකිය.

ii. කාන්තා කාර්යාංශයේ නිළධාරීන් විශේෂයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් හා චක්‍රීය අරමුදල ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය ලේකම්වරු, නි.අ. හා ස.අ.වරු සමඟ සම්බන්ධය කාන්තා කාර්යාංශය මගින් වර්ධනය කළ යුතුය. මෙම වැඩ සටහන පිළිබඳව විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඔවුන්ගේ සහයෝගය හා ක්‍රියාශීලී සහභාගිත්වය ලබාගතයුතුය. සාකච්ඡා මගින් නිලධාරීන් හා ප්‍රතිලාභීන් මුහුණ දෙන ප්‍රශ්න හා සංරෝධක හඳුනා ගත යුතුය.

iii. අදළ ප්‍රා.ලේ. කාර්යාල මගින් ක්‍රියාත්මක කෙරෙන කාන්තා ස්වයං රැකියා වැඩසටහන් ප්‍රගති සාමාලෝචනයට භාජනය කළ යුතු වන්නේය. මාසිකව ප්‍රගති සමාලෝචනය කරන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ න්‍යාය පත්‍රයට මෙම වැඩසටහන ඇතුළත් කිරීම තුළින් එබඳු යාන්ත්‍රණයක් සකසා ගත හැකිය.

iv. පවතින පරතරය අවම කිරීම සඳහා කාන්තා කාර්යාංශයේ හා ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් නිතර සංනිවේදනය ශක්තිමත් හා කඩිනම් කළ යුතුය.

v. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී දේශපාලන බලපෑම අවම/ නැති කිරීම සඳහා සතුටුදායක පියවර ගතයුතුය.

vi. දැනට ක්‍රියාත්මක ණය ඉල්ලුම් පත් අනුමත කිරීමේ ක්‍රමය ව්‍යාකූල බව පෙනේ. එහෙයින් අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීම සඳහා ණය අනුමත කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරිය යුතුය.

vii. කාන්තා සංගම්වල නිලධාරීන්ගේ වැරදි ක්‍රියාවන් නවත්වා එහි සාමාජිකාවන්ටද ණය ලබා දියයුතුය.

viii. කාන්තා සංවිධානවල නිලධාරීන් තුළ ඇති වැරදි අවබෝධය නැතිකරනු සඳහා අඩු පොළියකට ණය දීමේ ක්‍රමයක් සැකසිය යුතුය. පොළිය පිළිබඳ ගන්නා කරුණු ක්ෂේත්‍ර නිලධාරීන්ට හා කාන්තා සම්ගම් නිලධාරීන්ට දැනුම් දිය යුතුය.

ix. මෙම ස්වයං රැකියා වැඩසටහන ක්‍රියාත්මක කරන ස.අ.වරුන්ට ගිවිසගත් දිරිදීමනාවක් ගෙවිය යුතුය. මෙයට පෙර පැවති දිරිදීමනා ක්‍රමය පිළිබඳ ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු අසතුටට පත්වී සිටිති.

x. කාන්තා ප්‍රතිලාභිනියන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රගතිය නම් ස්වයං රැකියා ව්‍යාපෘතිය මගින් නිපදවෙන ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට නොහැකිවීමයි. එහෙයින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවස්ථාවන් ලබාදීම. ව්‍යාප්ත කිරීම කළ යුතුය.

xi. ණය ලබාගත් අයගේ වානිජමය හැකියාවන් දියුණු කර ගැනීම සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන ව්‍යාප්ති පුහුණුව ප්‍රමාණවත් නොවන බව ඔවුන්ගේ පිළිතුරයි. එහෙයින් මෙම අංශයේ කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රතිලාභී කාන්තාවන්ගේ පුහුණු වැඩසටහන් පුළුල් කළ යුතුය.

**කෙරෙමින් පවත්නා අධ්‍යයන**

1. ඉඩම් හිමිකම් සම්බන්ධිත සේවා ව්‍යාපෘතියේ මූලික සමාජ ආර්ථික සමීක්ෂණය.

පර්යේෂකයෝ :

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ්.ජී. ජයසේන | - | සම්බන්ධීකාරක |
| එම්. හේනෙගෙදර මහතා | - | ප.පූ.නි. |
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | ප.පූ.නි. |
| එම්.එස්. සේනානායක මහතා | - | ප.පූ.නි. |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - | ප.පූ.නි. |

අධ්‍යයන ප්‍රදේශ : දිවුලපිටිය, උඩපළාත සහ බලංගොඩ.

ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව මගින් මෙම අධ්‍යයනය කිරීමට ආයතනයට ආරාධනා කරන ලදී. අධ්‍යයනයේ අපේක්ෂිත අරමුණු පහත සඳහන් වේ.

i. සමාන්තර සමාජ හා ආර්ථික විශ්ලේෂණයන් මගින් ව්‍යාපෘති ප්‍රදේශ තුනෙහි ගම්වාසීන් (ව්‍යාපෘති ප්‍රතිලාභීන්) ගේ ව්‍යාපෘතියට පෙර සමාජ ආර්ථික තත්ත්වයන් පිළිබඳව දත්ත පදනමක් නිර්දේශ කිරීම.

ii. සමාන්තර ඇගයීම් අධ්‍යයනයන් සඳහා පවතින ඉඩම් පරිහරණ රටාවන්, ඉඩම් හිමිකම හා භුක්ති ක්‍රම පිළිබඳව ගම්මට්ටමේ දත්ත එකතු කර වාර්තා ගත කිරීම.

iii. ව්‍යාපෘතියේ සාධනීය හා නිෂේධනීය අංග හඳුනා ගැනීම.

iv. නියමු ව්‍යාපෘතිය පිළිබඳව මහජනතාව හා එහි ඉඩම් හිමිකරුවන් දැනුවත් කරමින් ඔවුන් ව්‍යාපෘතිය සඳහා සූදානම් කරනු පිණිස පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය හා ඉඩම් කළමනාකරණය පිළිබඳ සාධනීය තොරතුරු සැපයීම.

v. ඉඩම් හිමිකම් ව්‍යාපෘතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක වූ විට සිදු වෙන වැදගත් වෙනස්වීම් සක් සුදක්සේ පැහැදිලිවන විට නියමු හා පාලිත ප්‍රදේශවල ප්‍රති සමීක්ෂණයන් කිරීම සඳහා පදනම සැකසීම.

vi. ඉඩම් හිමිකම් ව්‍යාපෘතිය රට මුළුල්ලේම ක්‍රියාත්මක කිරීම සඳහා ආදර්ශනයක් සම්පාදනය කිරීම.

vii' සමීක්ෂණයේ සොයාගැනීම් අනුව ව්‍යාපෘතිය සැකසීමේ කටයුතු වෙනස් කිරීම හා වර්ධනය කිරීම සඳහා නිර්දේශයන් කිරීම.

ඉහත සඳහන් කළ නියමු ව්‍යාපෘති ප්‍රදේශ තුනෙහි ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. අධ්‍යයනය 2001 අප්‍රේල් මාසයෙහි නිම කිරීමට නියමිතය.

පූර්ණ අයවැය රු.404,685 (මෙම මුදල ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ ඉඩම් හිමිකම් ව්‍යාපෘතියෙන් සපයන ලදී.)

**වෙනත් කටයුතු**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට කරන ලද වැඩ

i. ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා අගෝස්තු 1-5 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය නිලධාරීන් හා ගොවීන් සඳහා පැවැති සහභාගිත්ව හා ක්‍රියාශීලී ග්‍රාමීය සැළසුම් පිළිබඳ වැඩසටහන සම්බන්ධීකරණය කළේය.

ii. ආචාර්ය ජයසේන කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණ අංශයේ සේවයේ නියුක්ත සහකාර ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩ සටහනේ සම්පත්දායකයෙකු ලෙස මාර්තු 27 වැනි දින සහභාගිවිය.

iii. එස්.ආර්. බණ්ඩාර මිය සැප්තැම්බර් 21-22 දිනවල පැවැති තිරසාර කෘෂි සංවර්ධනය සඳහා පාරිසරික අධ්‍යාපන පුහුණු වැඩමුළුවේ සහාය සම්බන්ධීකාරක ලෙස කටයුතු කළාය.

# කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ අංශය

## කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ආචාර්ය ඩී. තෙන්නකෝන් | - අංශ ප්‍රධාන |
| ආචාර්ය ඩබ්.ජී. සෝමරත්න | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| එස්. ධර්මලිංගම් මෙණෙවිය | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| එම්.එස්. සේනානායක මහතා | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| පී. ආර්. වීරක්කොඩි මිය | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී |
| පී.ඩී.ජේ. ආනන්ද මහතා | - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී (අධ්‍යයන නිවාඩු) |

## නිමකළ අධ්‍යයන

### 1. සුළු ගොවීන් උදෙසා කෘෂිකාර්මික සේවා සැපයුම් පද්ධති ශක්තිමත් කිරීම උදෙසා වන ඒකාබද්ධ වැඩසටහන - පළමු වටය - මොරගොල්ල වැඩසටහන (1995-2000)

පර්යේෂකයෝ : ආචාර්ය ඩී. තෙන්නකෝන් - සම්බන්ධීකාරක
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ගොවිජන සේවා ප්‍රදේශයේ නිලාගම ග්‍රාම නිලධාරී වසමේ හා මොරගොල්ලේ මෙම කාර්ය බද්ධ පර්යේෂණ 1995/2000 තුළදී ක්‍රියාත්මක කෙරිණ. මෙයට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයුවේ බංග්ලාදේශයේ ආසියා හා පැසිපික් කලාපීය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය මගිනි. අත්හද බැලීමක් ලෙස තෝරාගත් ප්‍රදේශවල කෘෂිකාර්මික සේවා සහ යෙදවුම් සැපයුම් පද්ධති ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියෙහි මූලික ක්‍රියාකාරී හා පර්යේෂණාත්මක අංගය විය. අදාළ සංවර්ධන වන රටවල පහළ මට්ටමේ කෘෂිකාර්මික ඵලදායිතාවය දිළිඳුභාවය සහ ආහාර අනාරක්ෂිතභාවය හඳුනාගැනීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය සර්ඩැප් සහ වෙනත් සම්බන්ධිත ආයතන මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් උත්සාහ දරනු ලැබීය. සුළු ගොවි අංශයේ ඵලදායිතාව ලාභදායිතාව සහ ගොවිපොළ ආදායම් වර්ධනය කිරීම සඳහා සුළු ගොවි ජනතාව සඳහා වන කෘෂිකාර්මික පහසුකම් සැපයීමේ පද්ධති ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ වැඩ සටහනක් බිහි කිරීම හා ශ්‍රී ලංකාවේ විෂය අධ්‍යයනය මගින් ආයතනික හැකියාවන් වර්ධනය කිරීමේ හැකියාව පිළිබඳ අත්දැකීම් ලබාගැනීම මෙම කාර්ය බද්ධ පර්යේෂණයේ අභිමතාර්ථය විය.

පසුගිය පර්යේෂණයන් පදනම් කොටගත් සුළු ගොවියන් මුහුණපාන ප්‍රතිරෝධකයන් මෙලෙස යැයි හඳුනාගෙන ඇත.

සුළු ගොවියන්ට කෘෂිකාර්මික සේවාවන් හා යෙදවුම් ලබා ගැනීමට නොහැකිවීම හෝ සුළුවෙන් ලැබීම විශේෂයෙන් තීරණගැනීමේ ක්‍රියාවලියේදී ග්‍රාම සංවර්ධන ක්ෂේත්‍රයෙහි සුළු ගොවීන්ගේ සහභාගිත්වය සීමාවීම හෝ නොසලකා හැරීම සියලු මට්ටම්වලදී විශාල ලෙස මධ්‍යගත වූ කෘෂිකාර්මික ග්‍රාමීය සේවා මගින් සුළු ගොවීන්ගේ අවශ්‍යතාවයන් නොසලකා හැරීමක් බවට පත්විය.

ප්‍රාදේශීය ගම්මට්ටමේ ක්ෂේත්‍ර නියෝජිතයන්ගේ ගම් මට්ටමේ නිලධාරීන්ගේ හා සංවිධානවල නායකයින්ගේ ප්‍රමාණවත් නොවන අධ්‍යාපනනය, පුහුණු සම්බන්ධීකරණය සහ දුර්වල වෘත්තීයමය තත්ත්වය

පර්යේෂකයෝ, දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, වසම් මට්ටමේ නියෝජිතයන්, ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් සහ නියෝජිතයන් අතර මෙන්ම අධ්‍යාපනය ව්‍යාප්තිය, පුහුණුව ගොවිපොළ ණය සැපයුම යෙදවුම් අලෙවිය සහ ගබඩා කිරීම වැනි කටයුතුවල යෙදෙන ආයතන අතරත් සම්බන්ධීකරණයක් නොමැතිවීම.

කාර්ය බද්ධ පර්යේෂණයන් පශ්චාත් ඇගයීම් දර්ශනයන් සකස් කිරීමට සහ වර්ධනය කිරීමට මහ පෙන්වීමක් ලෙස සැලකෙන මෙම ව්‍යාපෘතියෙහි පරිපතය සහ අරමුණ පහත සඳහන්වේ.

කෘෂිකාර්මික සේවා හා යෙදවුම් පුළු ගොවියන්ට ලබාගැනීමට පහසුවනු පිණිස ප්‍රාදේශීය මට්ටමින් ආයතනික පදනමක් බිහිකිරීම හා පර්යේෂණ කිරීම ගොවියන් හා සම්බන්ධ කිරීම මහින් කෘෂිකර්ම හා ග්‍රාමීය සේවා අධාර විමධ්‍යගත කිරීම. කෘෂිකාර්මික සේවා ගොවීන්ගේ අවශ්‍යතාවය අනුව ලබාගැනීමේ ඉඩ පහසුකම් ලබා ගැනීමට අවසර ලැබෙන ගොවීන් තීරණ ගැනීමට හැකිමට්ටමට පත් කරනු පිණිස ගම් මට්ටමේ බලමුළු ගැන්වීම් හැකියාවන් ගොඩනැන්වීම සහ සංවිධාන පිහිටුවීමේ උචිත වැඩ සටහනක් ආරම්භ කිරීම ක්ෂේත්‍ර නියෝජිතයන්ගේ පුහුණු කිරීම් සහ සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරීම ව්‍යාප්තිය, අධ්‍යාපනය පුහුණුව ණය සැපයුම අලවිය,පසු අස්වනු සැකසීම වැනි කාර්යයන්හි නිරත ආයතන අතර මෙන්ම පර්යේෂකයන් හා ක්ෂේත්‍ර නියෝජිතයන් අතර සම්බන්ධය වර්ධනය කිරීම.

මෙම වැඩ සටහන්වලට අරමුදල් සපයන ආසියාතික හා පැසිපික් කලාපීය ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානයට 1999 දී කාලීන ඇගයුම් සඳහා හා මෙම වැඩ සටහනේ ඉදිරි පැවැත්ම පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. 1999 ජනවාරි මැයි කාණ්ඩවලදී අවසාන ඇගයුම් හා ලේඛන ගත කිරීමේ කටයුතු කර ගෙන ගිය අතර 2000 මාර්තු මාසයේදී අරමුදල් සපයන ආයතනයට අවසාන පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කරන ලදී. 2001 පෙබරවාරි මාසයේදී අවසාන අන්තර් ජාතික වැඩ මුළුව පැවැත්වීම යෝජනා කර ඇත.

## 2. කෘෂි ව්‍යාප්ති සේවාව පෞද්ගලීකරණය සඳහා ඇති විභවය හා බාධක හඳුනාගැනීම.

පර්යේෂණ කණ්ඩායම - රේණුකා වීරක්කොඩි - සම්බන්ධීකරන නිලධාරී
- ෂාමිණී ධර්මලිංගම්
- ගාමිණී රත්නායක

මෙය ශ්‍රී ලංකාවේ කෘෂි ආහාර බෝග නිෂ්පාදන අංශය තුල කෘෂිව්‍යාප්ති සේවාව පෞද්ගලීකරණය සඳහා ඇති විභවය හා බාධක හඳුනාගැනීම උදෙසා සිදු කරන ලද අධ්‍යයනයකි. පෞද්ගලික කෘෂි ව්‍යාප්ති සේවයක් සඳහා දයකත්වය ලබා දිය හැකි පෞද්ගලික අංශයෙන් හා ගොවි සමාජයෙන් එකතු කරගන්නා ලද දත්ත මත මේ අධ්‍යයනය පදනම් වී ඇත. 1999 වර්ෂයේ ඔක්තෝබර් මස ආරම්භ කරන ලද අතර 2000 දෙසැම්බර් මස වන විට අධ්‍යයනය අවසන් කර ඇත.

වානිජ්‍ය කෘෂිකර්මයට වඩාත් බර ප්‍රධාන ගොවිපළ පද්ධති දෙකක් ඇසුරින් ක්ෂේත්‍ර විමර්ශණ කටයුතු සිදු කර ඇත. එනම් ලොකු ලූණු වගාව ප්‍රමුඛ වියලි කලාපීය එළවළු වගා පද්ධතිය හා අර්තාපල් වගාව ප්‍රමුඛ උඩරට එළවළු වගා පද්ධතිය මේ සඳහා තෝරාගෙන ඇත. අවසාන අධ්‍යයන වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යයන සොයාගැනීම් පහත පරිදිය.

ශ්‍රී ලංකාවේ කෘෂි ආහාර බෝග නිෂ්පාදන අංශය තුළ කෘෂි ව්‍යාප්ති සේවය පෞද්ගලිකරණය සඳහා ඇති විභවය හා බාධක හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථයයි. පෞද්ගලික කෘෂි ව්‍යාප්ති සේවාවන් සැපයීමට හැකියාවක් ඇති පෞද්ගලික අංශයේ දයකයන්, ගොවි සමාජය, කළමනාකරණ හා ක්ෂේත්‍ර මට්ටමේ කෘෂි ව්‍යාප්ති සේවා කටයුතු වල නියැලුනු පුද්ගලයන් යනාදී ප්‍රභවයන්ගෙන් එකතු කරගන්නා ලද ප්‍රාථමික හා ද්විතික දත්ත හා තොරතුරු මත මේ අධ්‍යයනය පදනම් වී ඇත.

**අධ්‍යනයෙන් ඉස්මතුවන ප්‍රධාන කරුණු,**

වත්මන් කෘෂි ව්‍යාප්ති සේවාව රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකේ එක්ව පැවැත්ම තුළ සංවිධානගත වී ඇති අයුරු දක්නට ලැබේ. මේ නිසා ව්‍යාප්ති සේවාව සැපයුම තුළ විශාල විවිධත්වයක් නිරීක්ෂණය කල හැකි අතර එමහින් අනුග්‍රාහකයන් හට තොරතුරු තෝරාගැනීම සඳහා විශාල අවකාශයක් හිමි වී ඇත. ජනමාධ්‍ය, ක්ෂේත්‍ර ආදර්ශන, ගොවි පුහුණු වැඩසටහන්, හා කෘෂි ව්‍යාප්ති නියෝජිතයින් හරහා සිදුකරන පුද්ගලික සබඳතා යනාදි විශාල පරාසයකින් යුත් සංනිවේදන ක්‍රම භාවිතා කරනු දක්නට ලැබේ. පෞද්ගලික අංශයේ නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය උදෙසාම සිදුකරන සුවිශේෂ කාර්යභාරය හා

රාජ්‍ය අංශයේ පර්යේෂණ ප්‍රතිඵල සංනිවේදනය පෙරදැරි කරගත් සේවාව කෘෂිව්‍යාප්ති සේවාව කෙරෙහි අඩු ඉල්ලුමක් නිර්මාණය කිරීම කෙරෙහි හේතුපාදක වී ඇත. පෞද්ගලික කෘෂිව්‍යාප්ති සේවාවන් දියත් කිරීම කෙරෙහි පෞද්ගලික අංශයේ ඇති කැමැත්ත විවිධ සාධක මත සීමාවනු දක්නට ලැබේ. කෘෂිකාර්මික මූලධර්මයන්ට අනුව, කෘෂිකාර්මික තොරතුරුවල දක්නට ලැබෙන පොදු භාණ්ඩ ගුණය, පෞද්ගලික අංශයේ ගොවි සමාජය පිළිබඳ අහිතකර ආකල්ප, කෘෂිකාර්මික ව්‍යවසායන් ගෙන් ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය, රාජ්‍ය අංශයේ අප්‍රමාණවත් දිරිගැන්වීම, ප්‍රමාණවත් තොරතුරු පද්ධතියක් පෞද්ගලික අංශය සතු නොවීම හා තාක්ෂණ උත්පාදන වැඩ සටහන් සඳහා ආයෝජනයට මැලිවීම, ගොවීන් හට පෞද්ගලික සේවා සඳහා මුදල් ගෙවීමේ අපහසුතා හා පෞද්ගලීකරණ සංකල්පය කෙරෙහි පොදුවේ ගොවි සමාජය දරණ විරෝධතාවය මෙසේ පෞද්ගලික අංශයේ මැදිහත්වීම කෙරෙහි බලපා ඇත. නමුත් සාහිත්‍ය විමර්ෂණයෙන් හෙළිදරව් වන පරිදි දියුණු මෙන්ම දියුණු වෙමින් පවතින රටවල්වලින් පෞද්ගලික කෘෂි ව්‍යාප්ති සේවා පිළිබඳ අත්දකීම් හමුවේ. එහෙත් එවැනි ක්‍රම දේශිය වශයෙන් දියත් කිරීමේදී සැළුවම ගැලපේද යන්න පිළිබඳ විමර්ශනය කළ යුතුව ඇත.

**අධ්‍යයනයේදී හඳුනාගත් ගැටළු**

- විවිධ කෘෂි ව්‍යාප්ති සේවා සැපයුම් අංශ අතර සම්බන්ධීකරණ දුර්වලතා
- ගොවි ගැටළුවලට වඩාත් උචිත විසඳුම් තෝරා ගැනීමේදී ගොවීන් මුහුණපාන ගැටළු
- කෘෂි ව්‍යාප්ති නියෝජිතයන්ගේ අදක්ෂතාවය හා ඔවුන්ගේ සීමිත මැදිහත්වීම්
- සාමාන්‍ය ගොවි ජන අධ්‍යාපනය පිළිබඳ අඩු උනන්දුව
- ජනමාධ්‍ය භාවිතය සඳහා ගොවීන්ට ඇති සීමාකාරීකම්
- ගොවි ගැටළු හා අදාල විසඳුම් පිළිබඳ දක්වන අඩු උනන්දුව
- කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම සඳහා පෞද්ගගික අංශයේ උනන්දුව ප්‍රමාණවත් නොවීම
- අනෙකුත් රටවල අත්දකීම් සැළුවම අත්හද බැලීමේ දී ඇතිවන ගැටළු

**මෙම දුර්වලතා මගහරවා ගැනීම පිණිස පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ**

- තාක්ෂණ සැකසුම් මධ්‍යස්ථාන හරහා විවිධ ව්‍යාප්ති සේවා අංශ සම්බන්ධීකරණය
- ඵලදයි ගොවි අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සියළු ගොවීන්ට දැනුම ලබාදීම
- පුහුණුවලත් ක්ෂේත්‍ර නිලධාරීන් සේවයේ යෙදවීම
- ගොවි සේවන නියාමක ගේ සේවය තුළින් ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධීකරණය
- ජනමාධ්‍ය භාවිතය වර්ධනය කිරීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ මැදිහත්වීම උනන්දු කිරීම
- ප්‍රාග්ධන සූක්ෂම පර්යේෂණ කටයුතු සඳහා රාජ්‍ය අංශයේ සහනය හා බදු සහන ලබාදීම
- පර්යේෂණ - ව්‍යාප්ති සේවා සබඳතා වැඩිදියුණු කිරීම
- කෘෂි ව්‍යාප්ති සේවා දියත් කිරීමේදී පෞද්ගලික අංශයේ සහය ඇතිව රාජ්‍ය අංශය මඟින් දියත් කරන "පිරිවැය ආවරණ" ක්‍රම අත්හද බැලීමේ මට්ටමින් දියත් කිරීම

**3. ශ්‍රී ලංකාවේ දිළිඳුභාව පිටුදැකීමේ කාර්යබද්ධ පර්යේෂණ වැඩසටහන : ණය පදනම් කරගෙන ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය හා මධ්‍යම නුවරගම් පළාතේ කාර්ය බද්ධ පර්යේෂණය.**

පර්යේෂකයෝ : ආචාර්ය ඩී. තෙන්නකෝන් (සම්බන්ධීකාරක)
එම්.එස්. ගෞරිශංකර් මයා
ආර්.එල්.එන්. ජයතිස්ස මයා
එස්.එම්.ඒ. සමරකෝන් මහතා

මෙම ක්‍රියාබද්ධ වැඩසටහන 1998 ජුලි මාසයේදී ආරම්භ වූ අතර 1999 ක්ෂේත්‍ර විමර්ශනයන්ට බාධාවක් ඇති වූ හෙයින් 1999 දී අවසන් කිරීමට තීරණය කෙරිණ. ක්ෂේත්‍ර විමර්ශන අංශ තුනකින් සමන්විත විය.

1. 1998 ජුලි සිට දෙසැම්බර් දක්වා කෙරෙන ක්ෂේත්‍ර විමර්ශන
2. ණය මගින් ආදායම් උත්පාදන කටයුතු හඳුනා ගැනීම හා
3. දිළිඳුභාවය පිටුදැකීම සඳහා නියත උපාය මාර්ග

ණය ආධාර මගින් ආදායම් වැඩි කිරීම පිළිබඳ ඇගයීමක් කිරීම මෙහි අරමුණයි. කෙසේ වුවද, 1998 හා 1999 වර්ෂවලදී ක්‍රියාත්මක සැළැස්මක් සකස් කරන ලෙස පර්යේෂකයන්ට ඉල්ලීමක් විය. ක්ෂේත්‍ර දත්ත හා තොරතුරු එකතු කිරීම 2000 ජනවාරි සිට මාර්තු දක්වා මාස වලදී අවසන් කරන ලදී.

"කලාපීය රාමුව" පදනම් කරගෙන සම්ප්‍රදායික ග්‍රාම සංවර්ධන ප්‍රවේශය අනුව දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරෙන බොහෝ ව්‍යාපතිවලට එහි වෙසෙන ජනගහනයේ වරප්‍රසාද අහිමි කොටස් මගහැරී ඇත. දිළිඳුභාවය ඉලක්ක කිරීම පිළිබඳ දැනුම උත්පාදනය කෙරෙන මෙම අධ්‍යයනයේ අත්දැකීම්වලින් එබඳු ව්‍යාපෘති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ආධාරවේ.

දෙවැනි පරපුරේ ප්‍රශ්න අතිශයින් උග්‍රවී සමස්ත ආර්ථිකය වෙලාගෙන ඇති ලෙසක් පෙනෙන දිවයිනේ උතුරු ප්‍රදේශයේ ඉතා පැරැණි ජනාවාසයක් වන මහවිලච්චිය ජනාවාසයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ප්‍රදේශයේ සම්පත්, කුශලතා හා ආයතනික ප්‍රතිසංස්කරණ පිළිබඳව ප්‍රතිලාභීන්ගේ දැනුම වැඩි කිරීම අරමුණු කරගෙන දිළිඳුභාවය ඉලක්ක කිරීමට සහභාගිත්ව පිවිසුම ඉහළ නැංවීමටද කාර්ය සාධන මට්ටම හා සහභාගිත්වය පිළිබඳව පර්යේෂණාත්මක සොයාගැනීම් ලේඛන ගත කිරීමට ද සැලසුම් කර ඇත.

දිළිඳු ජනතාවට ණය ලබාදීමට පිළිගත හැකි පදනමක් ඇති බවත්, ණය පදනම් කරගත් ආදායම් උත්පාදනය කිරීමේ බොහෝ වැඩසටහන් සාර්ථක හා වැය කාර්යක්ෂමතාවයක් ඇති බවත් මෑතදී කරන ලද පර්යේෂණවලින් හෙළි වී තිබේ. කෙටි කළකින් තිරසාර ලෙස ආදායම වැඩිකර ගැනීමට හැකිවන ස්වයංරැකියා, බාහිරරැකියා, පෞද්ගලික සම්පත් ආයෝජන කිරීම වැනි ක්‍රියාදාමයන් මගින් එබඳු වැඩසටහන් වලින් දිළිඳු බව දුරලීමට කටයුතු කර තිබේ. ණය භාවිතා කිරීම පිළිබඳ දැනුමක් ලබාදීමත් ගොවීන්ගේ අවශ්‍යතා අනුව රාජ්‍ය සහායක සේවා ලබාගැනීම සම්බන්ධීකරණය කිරීමත් මෙම ව්‍යාපෘතියේ සේවා කට්ටලයට ඇතුළත් වී තිබේ. මෙම වැඩසටහනේ විශේෂිත ලක්ෂණය වනුයේ, තිරසාර භාවය පිළිබඳව ස්ථිර සහතිකයක් දිය නොහැකිවුවත් බලාපොරොත්තු ප්‍රතිලාභ හා ජයග්‍රහනයන් බොහෝ දුරට දිනා ගැනීමට හැකියා වර්ධනය කිරීමට ව්‍යාපෘතියේ අංගයන් සමත් විය යුතු බවයි. ග්‍රාමීය දිළිඳුභාවය අඛණ්ඩ පැවැත්මේ යථාර්ථය තේරුම් ගෙන ඇති මෙම ව්‍යාපෘතියෙහි අංගයන් මෙසේය.

* ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපාංගය වන්නේ ණය හා සේවා සැපයුම් යාන්ත්‍රණය සමඟ සම්බන්ධීකරණය කිරීමයි. දිළිඳු පිරමීඩයේ සිටින දිළින්දන්ගෙනුත් දිළිඳු ජනතාවගේ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා අතිරේක උපාංග ප්‍රයෝජනයට ගනු ඇත.

* ස්ව ශක්තිය වර්ධන කිරීම, ප්‍රතිලාභීන් අතර සුහදතාවය දියුණු කිරීම හා සාර්ථකත්වය සඳහා ඇතිවන තරඟකාරී භාවයේ විනයක් ඇති කිරීම සඳහා ආයතනික දිරිමත් කිරීම් සිදු කරනු ලැබේ.

* කුශලතා හා දක්ෂතාවන්ට නිසි ප්‍රතිලාභ ලැබෙන පරිදි සහභාගිවීම් හැකියාව වර්ධනය කරන අතර ක්‍රියාකාරිත්වයේ බලපෑම මැන බැලීම හා ඇගයීමට හා දිළිඳු කුටුම්භයන්ගේ ක්ෂණික ප්‍රශ්න වලට විසඳුම් දීම සඳහා සහභාගිත්ව ප්‍රවේශයන් වර්ධනය විය යුතුය.

1999 වසරේදී පටන්ගන්නා ලද මෙම කාර්යබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියේ පළමු අදියර වසර 2000 පළමු කාර්තුවේදී ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අතුරු වාර්තාව 2000 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී.

### 4 සුළු ගොවියන් සඳහා කෘෂිකාර්මික සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ දෙවන වටයේ වැඩ සටහන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩම්පනේ.

පර්යේෂකයෝ : ආචාර්ය ඩී. තෙන්නකෝන් සම්බන්ධීකාරක
ආර්.එල්.එන්. ජයතිස්ස මයා

ශ්‍රී ලංකාව සඳහා උද්ධෘත විෂයයන් සේ සළකා ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩ සටහන් සර්ඩැප් ආයතනය විසින් ශ්‍රී ලංකාව සඳහා සකස් කරන ලද අතර එය ග්‍රාම නිලධාරී ව්‍යාපාරවල අන්තර්භද්ලීමක් ලෙස ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයට පවරන ලදී. මෙමගින් සර්ඩැප් සාමාජික රටවලට සුළු ගොවීන් සඳහා කෘෂිකාර්මික සේවා සැපයුම ශක්තිමත් කිරීමේ ජාතික සැළැස්මක් සකස් කිරීම එහි අරමුණ විය. මෙම කාර්ය බද්ධ පර්යේෂණ සඳහා ක්‍රියාකාරී සැළසුමක් සර්ඩැප් මගින් සකස් කරන ලද අතර එම ආයතනය විසින් මෙම ආයතනයේ පර්යේෂකයන් 1997 දී පුහුණු කරන ලදී. මෙහි පළමුවටයේ වැඩසටහන මොරගොල්ල - ගලේවෙලදී 1995 සිට 1998 දක්වා ක්‍රියාත්මක කරන ලදී. දෙවැනි වටය අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්තොරුව ගොවිජන කේන්ද්‍ර ප්‍රදේශයේ අඩම්පනේ ග්‍රාමයේ දී 1998 මැයි මාසයේ දී ආරම්භ කරන ලදී. සුළු ගොවි කේන්ද්‍රයෙහි ව්‍යාපාරික හැකියාව වර්ධනය කිරීම සඳහා කෘෂිකාර්මික සේවා හා යෙදවුම් සැපයීම සුළුගොවි ජනතාවට ලාභ ගැනීමේ ශක්තිය වර්ධණය කිරීම මෙම වැඩ සටහනේ මුඛ්‍ය පරමාර්ථය විය.

සිය ගොවිපොළ වාතාවරණයට ගැලපෙන අයුරින් වඩාත් යෝග්‍ය සම්බන්ධිත ක්‍රමවේදයන් ප්‍රාදේශීය පර්යේෂණ ආයතනවල සහායෙන් වසර 2000 සඳහා සකස් කර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදී. අවසාන පර්යේෂණ 2000 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර අධ්‍යයන පිළිබඳ ජාතික සමුළුවක් 2001 පෙබරවාරි මාසයේදී මෙම ආයතනයේ දී පැවැත්වීමට කටයුතු සූදනම් කර ඇත.

### 5. ගොවියා කේන්ද්‍රීය වූ කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ වැඩසටහන (ෆාම්) : අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ක්‍රියාත්මක කරන පළමුවටයේ කාර්යබද්ධ පර්යේෂණය

පර්යේෂකයෝ : ජී.ඩී.ජේ. ආනන්ද මහතා - සම්බන්ධීකාරක
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

මෙම ක්‍රියාබද්ධ පර්යේෂණ අධ්‍යයනයේ මූලික පරමාර්ථය විවිධ අංශවල පුද්ගලයින් අතර අන්තර් සබඳතාවය පවත්වා ගෙනයාම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංශය සම්බන්ධීකරණය කරනු ලැබේ. සමානත්වයකින් හා තිරසාර බවකින් යුතුව වර්ෂාවෙන් පෝෂිත ප්‍රදේශයන්හි සංරක්ෂණය, කළමනාකරණය හා කෘෂිකාර්මික සම්පත් භාවිතා කිරීමේ ශිල්පීයක්‍රමවල වැඩි දියුණුවක් ඇති කිරීම උදෙසා ප්‍රදේශයේ සම්පත් හිඟ ප්‍රජාවන්ගේ හා ගොවීන්ගේ හැකියාව සහභාගිත්ව ප්‍රවේශය මගින් පුළුල් කිරීමේ අරමුණු ඇතිව අනුරාධපුරයේ තිරප්පනේ දී මෙම වැඩ සටහනේ පළමුවටය 1995 දී ආරම්භ කර 2000 මැයි මාසයේදී දත්ත විශ්ලේෂණ ව්‍යාපෘතියේ අත්දැකීම් ඉදිරිපත් කිරීමේ කටයුතු අවසන්ව ඇත.

මෙය ක්‍රියාත්මක කළ ආයතන අතර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සමාජ සජීවීකරණය හා පශු ප්‍රගති ඇගයීම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (ස්වභාවික සම්පත් කළමණාකරන මධ්‍යස්ථානය) සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය ඇතුලත්ව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු, වන සම්පත් දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වේ. මෙමම ආයතනයේ කාර්යභාරය වනුයේ සහභාගිත්ව සැලසුම්කරණය, ක්‍රියාත්මකකිරීම හා ප්‍රාදේශීය සංවිධාන මගින් වැඩසටහන්වල ප්‍රගති තොරතුරු වාර්තා කිරීම හා සහභාගිත්ව ප්‍රවේශය පිළිබඳව පුහුණුව ලබාදීමත්ය.

1995 සිට 2000 කාලය තුලදී ආයතනයේ පර්යේෂණ කණ්ඩායම පහත සඳහන් කටයුතු අවසන් කිරීමට යෙදුනි.

* කුඩා ගොවි කණ්ඩායම් ආරම්භ කිරීම.

* ව්‍යවසායකත්ව කුසලතා ලබාදීම හා කුඩා කණ්ඩායම් ශක්තිමත් කිරීම සඳහා පුහුණු පාඨමාලා ඇති කිරීම.

* ගොවීන් අතර කණ්ඩායම් අලෙවිය හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව පුහුණු පාඨමාලා පැවැත්වීම.

* වැඩ සටහනේ අත්දැකීම් හා වැසි දියෙන් වගා කිරීමේ තාක්‍ෂණය පුළුල් ග්‍රාහක පිරිසක් අතර ප්‍රචාරණය කරනු පිණිස පාරම් නිව්ස් (ඉංග්‍රීසි) හා ෆාම් පුවත් (සිංහල) යන සඟරා ප්‍රකාශයට පත්කිරීම.

* ෆාම් ප්‍රවේශය පදනම් කරගෙන රූපවාහිනී වාර්තා වැඩ සටහන් නිෂ්පාදනය කිරීම.

විශේෂයෙන් කුඩා කණ්ඩායම් පිහිටුවීමේ දී විශාල ප්‍රගතියක් 1995 - 2000 වලදී ඇතිවිය. සහභාගිත්ව ක්‍රමය අනුව කිරිගව පාලනය, එළු පාලනය, අලෙවි සැල්, කෘෂි ළිං, පැල තවාන් ඇති කිරීම වැනි කටයුතු සිදුකරන කණ්ඩායම් ඇති කරන ලදී. තෝරාගත් ප්‍රතිලාභී කණ්ඩායම් සඳහා කෘෂි ලිං තැනීමට හා වානිජ වගාරටාවන් ඇති කිරීම සඳහා ව්‍යාපෘතියෙන් පහසුකම් සලසන ලදී. සහභාගිත්ව ක්‍රමවේදය අනුව තවාන් පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කණ්ඩායම් ඇති කරන ලද අතර ඒ අනුව පැල තවාන් පිහිටුවන ලදී. අනාගතයේදී ෆාම් ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට නම් තෘණමූල මට්ටමේ ක්‍රියාශීලි ආයතනික වාතාවරණයක් ඇතිවිය යුතු බවත් ගොවීන්ට සැළකිය යුතු ආර්ථික දිරිදීමනාවක් ලබාදිය යුතු බවත් පෙනී ගියේය.

1999 දෙසැම්බරයේ දී වැඩ සටහනේ පළමු වටය අවසන් වූ අතර 2000 ජූලි මාසයේ දී වැඩ සටහනේ අත්දැකීම් ලේඛන ගත කිරීම නිමකරන ලදී.

**කෙරෙමින් පවතින අධ්‍යයන**

**1. කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්කවල ගොවි සංවිධාන මගින් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය හා කෘෂි නිෂ්පාදන අලෙවිය පිළිබඳ කාර්යබද්ධ පර්යේෂණය**

පර්යේෂකයෝ : එම්.එස්. සේනානායක මහතා
ජී. පියරත්න මහතා

1996 වසරේ සිට ආයතනය විසින් ගොවි සංවිධාන මගින් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය හා කෘෂි නිෂ්පාදන අලෙවිය පිළිබඳ කාර්ය බද්ධ පර්යේෂණ මාලාවක් පවත්වන ලදී. මෙහි පළමුවන ක්‍රියාත්මක වැඩ සටහන් පුත්තලම හා මොණරාගල දිස්ත්‍රික්කවල 1996 දී ආරම්භ කර 1998 දී අවසන් කරන ලදී. පළමු වටයේ ක්‍රියාත්මක කිරීමෙන් පසුව මෙම වැඩසටහන අනෙකුත් සුදුසු දිස්ත්‍රික්කවලට ආදේශ කළ යුතු යැයි තීරණය විය. මෙම පදනම අනුව 1998 මැයි මාසයේදී දෙවන වටය මාතලේ හා කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරාගත් ගො.ජ. කේන්ද්‍ර බල ප්‍රදේශවල ආරම්භ කෙරිණ. පළමු වටයේ ක්‍රම වේදයම දෙවැනි වටය සඳහා උපයෝගි කරගනු ලැබිණ. යල හා මහ දෙකන්නයේ සම්ප්‍රදයික වගා රටාවට ගොවීන් පුරුදු වී සිටින අතර ධාන්‍ය හා එළවළු ඇතුළු අති විශාල නිෂ්පාදනයන් ප්‍රමාණයක් සාධාරණ මිලකට අලෙවිකර ගත නොහැකි වීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන බාධකය ලෙස හඳුනා ගනු ලැබිණ. ශ්‍රී ලංකාවේ සුළු ගොවීන් මුහුණපාන බලවත්ම අර්බුදය වන්නේ ගොවිපොලේදී ඔවුන්ගේ නිෂ්පාදනවලට අවම මිලක් ලැබීමයි. නිෂ්පාදන එකතු කිරීම, වර්ග කිරීම, ගබඩා කිරීම වැනි අලෙවියට සම්බන්ධ කටයුතු සිදුකිරීමට ගොවි ප්‍රජාවට සංවිධානයක් නොමැතිවීම සුළු ගොවි ජනතාවට අවම මිලක් ලැබීමට හේතු සාධක වී ඇත්තේය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වන්නේ පවතින විවිධ කෘෂි ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය හා ගොවි කණ්ඩායම් හා හවුල්කරුවන් අතර වෙළඳ සබඳතා ඇති කිරීමය.

**ව්‍යාපෘතියේ නියත අරමුණු වන්නේ :**

අධ්‍යයන ප්‍රදේශයේ පවතින කෘෂි ව්‍යාපාර හා කෘෂිකාර්මික අලෙවි පරිසරය අධ්‍යයනය කරන නිර්මාණශීලී කෘෂි ව්‍යාපාර පිළිබඳ අදහස් ප්‍රවර්ධනය කිරීම.

ගොවි සංවිධානයන් (රැස්කිරීම්, ගබඩාකිරීම්, සැකසීම්, පැකට් කිරීම් වැනි) පහදා කෘෂි ව්‍යාපාර හා අලෙවිකටයුතු කිරීමට උනන්දු කරවීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගොවි සංවිධානවලින් තෝරාගත් කුශලතා සහිත ව්‍යාපාරිකයන්ගෙන් සමන්විත අලෙවි කමිටුවක් පිහිටුවීම සහ ව්‍යාපෘති කාලය අවසන්වන විකවාතුවේදී ක්‍රියාත්මක වූ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.

වත්මන් කාර්ය බද්ධ පර්යේෂණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල, මාතලේ දිස්ත්‍රික්කයෙහි ලග්ගල - පල්ලේගම සහ හෙට්ටිපොළ - විල්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිදු කෙරේ.

ව්‍යාපෘතිය පහත සඳහන්වෙන අංග දෙකින් සමන්විත වේ.

**ක්‍රියාබද්ධ වැඩසටහන**

**පර්යේෂණ වැඩසටහන**

2000 වසරේ මැයි සිට දෙසැම්බර් අතර කාලයේදී ක්‍රියාබද්ධ වැඩ සටහන අවසන් විය. මෙම ක්‍රියාබද්ධ වැඩසටහන් යටතේ පර්යේෂකයන් විසින් පහත දක්වෙන වැඩකොටස් ඉටුකරන ලදී.

**අලෙවි කමිටු පිහිටු වීම**

ආරම්භයේදී අඹන්පොල, ලග්ගල-පල්ලේගම හා හෙට්ටිපොල-විල්ගමුව යන කොට්ඨාශවල අලෙවි කමිටු පිහිටුවන ලදී.

**අලෙවි කමිටු සාමාජිකයන් පුහුණු කිරීම**

අලෙවි කමිටුවල සාමාජිකයන්ට අලෙවි කටයුතු පිළිබඳ මූලික පුහුණු වැඩසටහන් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් විසින් පවත්වන ලදී.

**වෙළෙඳ සබඳතා ගොඩනැගීමේ කටයුතු**

ආයතනයේ ආධාරය ඇතිව අලෙවි කමිටු දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, දඹුළු ගොවි සමාගම, පෞද්ගලික අපනයන සමාගම් හා මූල්‍ය සංවිධාන හා සම්බන්ධ කරන ලදී. මෙම ආයතන සමඟ අලෙවි කටයුතුවල නියැලීම ගොවීන් විසින් ආරම්භ කර ඇත.

**කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය සහ පුහුණුව**

විවිධ රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන සමඟ සහයෝගයෙන් පුහුණු පාඨමාලා රාශියක් සංවිධානය කර තිබේ. මෙම පුහුණු පාඨමාලා සඳහා පහසුකම් සැපයීමට සමහර අරමුදල් සපයන සංවිධාන දැනටමත් කැමැත්ත පළ කොට ඇත. අඹිලිපිටියේ, කැකිරිවි ආහාර සැකසීමේ පුහුණු මධ්‍යස්ථානය බිඳුණු වැව් සේවා සංස්කරණ මධ්‍යස්ථානය, අපනයන සංවර්ධන මණ්ඩලය ආනමඩුව ගොවි සමාගමේ, බිම් මල් සංවර්ධන ව්‍යාපෘතිය වැනි සංවිධාන ඉහත සඳහන් අධ්‍යයන ප්‍රදේශවල පිහිටුවා ඇති අලෙවි කමිටු සාමාජිකයින්ට තාක්ෂණික පුහුණු පහසුකම් සැපයීමට පොරොන්දු වී ඇත.

**අධ්‍යයනයට සම්බන්ධිත ආයතන**

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
මාතලේ ප්‍රාදේශීය ආර්ථික අභිවර්ධන ව්‍යාපෘතිය
උඩරට ග්‍රාමීය පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව
ප්‍රාදේශීය ලේකම් කාර්යාල
දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - ශිෂ්‍යයන්ගේ "සුවදීපනී" වැඩසටහන
උඩරට සංවර්ධන බැංකුව

**ව්‍යාපෘතියේ ක්‍රියාකාරී වැඩ සටහන**

දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ ආධාරය ඇතිව ව්‍යාපෘති ප්‍රදේශ තුනෙහි කෘෂි නිෂ්පාදන අලෙවි කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

ඉහත සඳහන් අලෙවි කමිටුවලට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශවල කෘෂිකාර්මික අලෙවි කටයුතු සංවර්ධනයට හේතුවන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටද සැලසුම් කර ඇත. රීජ් ව්‍යාපෘතියේ හා උඩරට ග්‍රාමීය පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘති ප්‍රදේශවල බින්දු ජල චාරි මාර්ග පද්ධතීන් සපයනු ඇත. මෙම ආයතන මූලික පර්යේෂණ කටයුතු දැනටම අරඹා ඇත. මෙම අලෙවි මධ්‍යස්ථාන දෙකෙහි කෘෂිකාර්මික මාවත් සහ ගොඩනැඟිලි සංවර්ධනය කිරීම දැනටම ඇරඹී ඇත.

ප්‍රගති විමර්ශනය හා උපදේශකත්වය මෙම ආයතනයේ පර්යේෂණ කණ්ඩායම විසින් ඉටු කරනු ලැබේ.

ව්‍යාපෘති ප්‍රදේශයේ පළවෙනි ක්‍රියාකාරී වැඩ සටහන දැනටම ක්‍රියාත්මක වන අතර එය වසර 2000 දෙසැම්බර් අග වන විට අවසන් කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ දෙවැනි අදියර ලෙස මෙම ප්‍රදේශයේ අලෙවි සංවර්ධන කටයුතු ප්‍රගති විශ්ලේෂණය හා ඇගයීමේ කටයුතු ආරම්භ කර ඇත.

පර්යේෂණ කණ්ඩායම විසින් ව්‍යාපෘති කටයුතු නොනවත්වාම ක්‍රියාත්මක කළ අතර, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්කවල නිලධාරීන් එනම්, ප්‍රාදේශීය ලේකම්වරු, ගොවිජන සේවා දිස්ත්‍රික් නිලධාරීන්, ප්‍රදේශීය සභාවල සැලසුම් නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධානවල ක්ෂේත්‍ර නිලධාරීන් වැඩ සටහන සඳහා උපකාර සහ අධීක්ෂණය ලබා දෙන ලදී.

**2. ගොවියා කේන්ද්‍ර කොටගත් කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ වැඩසටහන : දෙවන වටයේ ක්‍රියාබද්ධ පර්යේෂණය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙමටවැව ගම**

පර්යේෂකයෝ - එස්.එම්.ජී. සමරකෝන්
ආර්.එල්.එන්. ජයතිස්ස

ගොවියා කේන්ද්‍ර කොට ගත් කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ වැඩ සටහන ප්‍රාදේශීය වැඩ සටහනකි. මෙම වැඩ සටහනට ආසියාතු කලාපීය රටවල් අටක සහභාගිත්වය ලැබේ. ඒවා නම් වශයෙන් චීනය, ඉන්දියාව, නේපාලය, පිලිපීනය, තායිලන්තය, වියට්නාමය සහ ශ්‍රී ලංකාවයි. හේන් ගොවීන් වැනි අවිධිමත් කෘෂිකාර්මික ක්‍රමවලට සම්බන්ධ අයගේ ජීවිකාව වැඩි දියුණු කිරීම සඳහා හීන සම්පත් සහ වර්ෂාපෝෂිත කෘෂිකාර්මික ක්‍රම මත ගොවීන් කේන්ද්‍ර කොට ගත් කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ වැඩ සටහන යොමුව ඇත.

ශ්‍රී ලංකාවේ ෆාම් වැඩ සටහනේ පළමු අත්දැකීම අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආදර්ශ හයක් ලෙස පැවැත්වීය. 1997 දී ආරම්භ වූ මෙම මැදිහත්වීම 1999 වර්ෂයේදී සිදු කෙරිණි. ෆාම් වැඩසටහන තිරප්පනේදී ලබා ගත් අත්දැකීම අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ගමක් වන දෙමට වැවෙහි කෘෂි නිෂ්පාදනය වර්ධනය කිරීම සහ ස්වාභාවික සම්පත් සුරක්ෂිත කිරීම කෙරෙහි මැදිහත්වීමට ප්‍රයත්න දරයි.

**කාර්යබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියේ යෝග්‍යතාව**

ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට වියළි කලාපීය කෘෂිකර්මය සැලකිය යුතු අන්දමින් දායකවේ. වී වෙනත් ධාන්‍ය භෝග සහ රනිල භෝග බොහෝ සෙයින් නිපදවෙන්නේ වියළි කලාපයේය. මේ අනුව මෙරට ආහාර සුරක්ෂිතතාවයේ තිරසාරභාය බොහෝ සෙයින් රඳා පවතින්නේ වියළි කලාපීය කෘෂිකාර්මික ප්‍රතිඵල අනුවය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සෘජුව බලපාන පහත සඳහන් ප්‍රශ්නවලට වියළි කලාපීය ගම්වාසි ගොවි ජනතාවගේ බොහෝ දෙනෙකු මුහුණ පා සිටිති.

* අවිධිමත් පාංශු හා ජල සංරක්ෂණය.

* ස්වාභාවික සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට නොගැනීම.

* ධාන්‍ය වර්ග හා රනිල භෝගවල අපේක්ෂිත නිෂ්පාදනය හා ගොවිපළ තුළදී නිරීක්ෂණය කරන ලද සැබෑ නිෂ්පාදනය අතර පරාසය.

* ගම්වල ඇති ස්වාභාවික සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට නොගැනීම හා ගොවිපොළ වානිජකරණයට යොමුවීම හා නව අවස්ථා ඇතිකිරීමට උනන්දු අඩුකම,

* මෙම ප්‍රශ්න නිරාකරණය සඳහා සැලකිය යුතු බාහිර මැදිහත්වීමක් අත්‍යාවශ්‍යය.

**ව්‍යාපෘති ඉලක්කයන්**

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තෝරාගත් ගමක සම්පත් හිඟ ගොවියාගේ හැකියාවන් වර්ධනය කිරීමයි. මෙමගින් ඔවුන් තුළ සමතුලිත හා තිරසාර වර්ධනයක් අපේක්ෂා කරණු ඇත. ඉහත ලැයිස්තුගත ගැටළුව ස්වභාවය අනුව ව්‍යාපෘතිය පහත සඳහන් ගැටළු නිරාකරණය කෙරෙහි වර්ධනාත්මක මැදිහත්වීමකට යොමු වනු ඇත.

* තෝරාගත් ගමෙහි ජල හා පාංශු සංරක්ෂණ පහසුකම් සැලසීම.

* ගමෙහි පවත්නා කෘෂි සම්පත් හා ස්වාභාවික සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට උනන්දු කරවීම.

* උස්බිම්, පහත් බිම් හා හේන් වගාවේ නිෂ්පාදනය ඉහළ දැමීමට අවශ්‍ය යෙදවුම් හා තාක්ෂණය සපයා දීම.

* ගමෙහි වෙසෙන සම්පත් හිඟ ගොවියන් වානිජ කෘෂිකර්මයට උනන්දුකරවීම හා එමගින් ඔවුන්ගේ වානිජමය හැකියාව වර්ධනය කිරීම.

* ගොවියාගේ සහජීවනය සඳහා අවසාන වර්ධන ප්‍රයත්නය දැරීම.

ග්‍රාම් වැඩ සටහන සඳහා වූ මෙම ව්‍යාපෘතිය ඉහත ඉලක්කයන් කේන්ද්‍ර ගත කරමින් ක්‍රියාවට නංවා ඇත. ග්‍රාම් වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතිය ලෙස මෙවැනිම වැඩ සටහනක් තිරප්පනේදී ක්‍රියාවට නංවා ඇත. මෙම ව්‍යාපෘතිය නිරීක්ෂණයේදී වර්තමාන කෘෂිකාර්මික ආදායම් උත්පාදනය පහළ මට්ටමක පැවතියද ග්‍රාම් මැදිහත්වීම තුළ ගොවි පොළ තුළදී ජීව විද්‍යාත්මක ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය ඉහළ නංවීමට සමත්ව ඇති බව පෙණුනි. ඉහත නිරීක්ෂණයන්ට අනුව ගොවිකටයුතු සඳහා වන මෙවැනි මැදිහත්වීම් තුළින් පෙනීයන්නේ මේ හා සමාන ගැටළු ඇති වෙනත් ගොවිබිම්වල ගොවීන්ගේ සමෘද්ධිය කෙරෙහි මෙවැනි ව්‍යාපෘති යොදා ගත හැකි බවයි.

**දෙවන වටය සඳහා තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශය**

මහඉලුප්පල්ලම පර්යේෂණ ස්ථානයට සැතපුම් 50 ඇතින් පිහිටා ඇති උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සිවකුළම ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ, දෙමැට වැව ග්‍රාම නිලධාරී වසමට අයත්, වියළි කලාපීය, දෙමට වැව නමින් හඳුන්වන ගම ව්‍යාපෘති ප්‍රදේශය වේ.

ගමෙහි පවුල් අසූහතරකි. ඉන් පවුල් විස්සක සාමාජිකයෝ ආරක්ෂක අංශවල හා වෙනත් රැකියාවල නිරතව සිටිති. වැව් තුනක් යටතේ කුඹුරු අක්කර 160 වගාකරනු ලබයි. ගමෙහි විශාලම වැව දෙමට වැව වන අතර අනෙක් දෙක වනුයේ කටුකැලියාව සහ බහළ ඉහුරුවැවයි. ගමෙහි ව්‍යාපෘති හෝ වෙනත් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක නොවේ.

**ව්‍යාපෘති කාලය**

වර්ෂ 2000 මහ කන්නයේදී ව්‍යාපෘති ආරම්භ විය. වර්තමානයේ ඇති මූල්‍ය සම්පත්වලට අනුකූලව සම්පූර්ණ ව්‍යාපෘතිය වසර දෙකකට සීමා වන අතර ව්‍යාපෘතිය වසර 2001 දෙසැම්බර් මාසයේදී අවසන්වීමට නියමිතය. කෙසේ වුවද වර්තමාන ක්‍රියාදමයන්ගේ සාර්ථකත්වය පදනම් කොට, ව්‍යාපෘතියේ වර්ධනාත්මක තත්ත්වය තුළ, ව්‍යාපෘති ප්‍රධානයන් හා අතිරේක අරමුදල් මත ව්‍යාපෘතිය තවත් වසර දෙකේ සිට හතර දක්වා කාලයකට ව්‍යාප්ත වනු ඇත.

**ව්‍යාපෘති ක්‍රියාකාරකම්**

සර්ව පාශ්වික ප්‍රවේශයක් මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන හෙයින් එහි වැඩ කටයුතු ගොවිපොළ සංවර්ධනයෙහි සමස්ථ කටයුතු හා බැඳේ.

සුවිශේෂී ව්‍යාපෘති ක්‍රියාකාරකම් පහත සඳහන් වේ.

* පහත් බිම්වල ඵලදායිතාව වර්ධනය කිරීම.

* උස්බිම් හා හේන් වගාවේ ඵලදායිතාව වර්ධනය

* එළු, ගව හා කුකුළු ගොවිපළවල් කේන්ද්‍ර කොට ගත් පාංශු සම්පත් සංවර්ධනය.

* වාරි මාර්ග හා මහාමාර්ග ඇතුළුව ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය.

* පාංශු හා ජල සංරක්ෂණය.

* ජංගම හා පුහුණු කිරීම් හා සංවර්ධනය ක්‍රියාකාරකම් මාර්ගෝපදේශනය හා ඇගයීම්

මෙම කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට ව්‍යාපෘතිය සකස් කළ පිරිස RRA සමස්ථ විශ්ලේෂණය මගින් මෙහෙයවන ලදී.

මෙම ක්‍රියාකාරකම් තුළින් යෝජිත ගොවි සමාජය මුහුණ දෙන අර්බුද හා ගැටළු විසඳීමට ප්‍රයත්න දරණු ඇත. මෙම ක්‍රියාකාරකම් සඳහා විසඳුම් ක්‍රියාත්මක කිරීමට ආයතන කිහිපයකට පැවරෙණු ඇත. ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන වනුයේ,

* පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (PDOA)

* පළාත් සත්ව සෞඛ්‍යය හා නිෂ්පාදන දෙපාර්තමේන්තුව (PDAPH)

* කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය (NRMC)

* ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (ARTI)

* ක්ෂේත්‍ර අස්වනු පර්යේෂණ හා සංවර්ධන ආයතනය (FCRI)

* කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය (SEPC)

**3. කෘෂිකාර්මික සේවා හා යෙදවුම් තාක්ෂණය ශක්තිමත් කිරීමේ ජාතික ඒකාබද්ධ වැඩ සටහන :**

ආසියාවේ සුළු ගොවීන් සඳහා ශ්‍රී ලංකාවේදී කරන ලද සිද්ධි අධ්‍යයනය

තෙවන වටය ක්‍රියාත්මක කිරීම සහ නුවර දිස්ත්‍රික්කයේ දෙලිපිටිය ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශයේ පුස්වැල්ලාවගම

පර්යේෂකයෝ : ආර්.එල්.එන්. ජයතිස්ස
ආචාර්ය ඩී. තෙන්නකෝන්

සර්ඩැප් මධ්‍යස්ථානයේ බාහිර පර්යේෂකයන්ගේ නිර්දේශයන් මත, මොණරාගල හා අටම්පනේ ගම්වල ක්‍රියාත්මක කළ ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය පදනම් කරගනිමින් නුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාගම ග්‍රාමයෙහි (ගම්පොළ ගොවිජන සේවා බල ප්‍රදේශයේ දෙලිපිටිය) තවත් පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට ඇත. ව්‍යාපෘති ඉලක්කයන්ට අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික සිද්ධාන්ත හඳුනාගැනීම සඳහා වසර දෙදහසේ මැයි හා ජූනි මාසවලදී සහභාගිත්ව ග්‍රාමීය ප්‍රවේශ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යයන ප්‍රදේශය තුළ ඇති ප්‍රධාන සමාජ ආර්ථික ලක්ෂණ හා කෘෂිකාර්මික ක්‍රම වාර්තා කිරීම සඳහා ග්‍රාමීය සමීක්ෂණයක් කරන ලදී.

ප්‍රාදේශීය කෘෂිකාර්මික සංවර්ධනය සඳහා උනන්දුවක් ඇති රාජ්‍ය නොවන ආයතනවල සහ රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නියෝජනයෙන්, පුස්සැල්ලාව ගම කෘෂිකාර්මික සේවා හා තාක්ෂණික සහයෝගිතා කමිටුව සහ පුස්සැල්ලාව ගම ග්‍රාම සංවර්ධන සභාව ස්ථාපිත කරන ලදී.

පහත සඳහන් කාර්යයන් පර්යේෂණ මට්ටමෙන් අත්හද බැලීමට හා ක්‍රියාත්මක කිරීමට සුදුසු බව අදාළ වැඩසටහන මගින් හඳුනාගෙන ඇත.

* පුස්සැල්ලාගම ග්‍රාමීය සංවර්ධන සමිති අරමුදල යටතේ සුළු ගොවි ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

* පශු සම්පත් සංවර්ධන වැඩසටහන

* යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන

* ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන

* අපනයන කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන

* පැළ තවාන් හා බීජ නිෂ්පාදනය

* වතු වගා සංවර්ධනය

* කෘෂිකර්ම නොවන අදයම් උත්පාදන වැඩ සටහන්

ඉහත වැඩ සටහන් ක්‍රියාත්මක කාලය තුළ ප්‍රතිලාභී ගොවියන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මාර්ගෝපදේශනය සැපයීම හා එම තත්ත්වයන් වාර්තාකරණය සඳහා පුහුණු විමර්ශන කණ්ඩායමක් යොදවා ඇත.

ක්‍රියාබද්ධ පර්යේෂණ කේන්ද්‍රීය කාර්යය වනුයේ, ග්‍රාම සංවර්ධන සමිතියේ, චක්‍රීය අරමුදලේ හා කෘෂි සේවා තාක්ෂණික සහයෝගිතා කමිටුවේ කටයුතු හා ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණයේ යෙදීමයි. මෙම වැඩ සටහන වසර 2001 දෙසැම්බර් මාසයේදී සම්පූර්ණ වනු ඇත.

## 4. ශ්‍රී ලංකාවේ ගිවිසි ගොවිතැන සමෝදනයේ විභවතාවයන් හා ප්‍රශ්න

පර්යේෂකයෝ - ආචාර්ය ඩබ්ලිව්. ජී. සෝමරත්න - සම්බන්ධීකාරක
ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා

හැඳින්වීම

දියුණු වෙමින් පවතින රටවල් වෙළඳපොළ හිතකර ප්‍රවේශයන් තුළින් සංවර්ධනයට පිවිසීමට යෝග්‍ය යැයි පිළිගනු ලැබුවද ගිවිසි ගොවිතැන හෝ බාහිර වගාකරුවන්ගේ යෝජනා ක්‍රමය වැනි ක්ෂුද්‍ර මට්ටමේ මැදිහත්වීම් තුළින් වෙළඳපොළ හා බද්ධ වනු දක්නට ලැබේ. විවෘත වෙළඳ ප්‍රතිපත්ති රාමුව තුළ ආර්ථික සංවර්ධනයේ හවුල්කරුවන් වනුයේ හුදෙක් රජයම පමණක් නොවේ. කෙසේ වුවද කෘෂිකාර්මික අංශයේ අවප්‍රමාණය වීම මගින් පෙන්නුම් කෙරෙන්නේ සමස්ථ සංවර්ධනයේ ආංශික විභවතාවයන් උපයෝගී කර ගැනීම පෞද්ගලික අංශය විසින් සිදුකර නොමැති බවයි. පෞද්ගලික හා වැවිලි යන දෙඅංශයම මගින් කෘෂිකර්මය සඳහා අඩු ආයෝජනයක් යොමු කිරීම මෙම අංශයේ විභවතාවයන් අවම ලෙස ප්‍රයෝජනයට ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

**අධ්‍යයනයේ අරමුණු**

ශ්‍රී ලංකාවේ වැවිලි නොවන කෘෂිකාර්මික අංශයේ උපාය මාර්ග වර්ධනය කිරීම සඳහා අලෙවි සමෝදන හැකියාව හඳුනාගැනීම සඳහා ගිවිසි ගොවිතැනේ (බාහිර වගාකරුවන්ගේ යෝජනා ක්‍රම) විභවතාවයන්, වෙළඳපොළ අවස්ථා හා දුර්වලතා විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ පුළුල් අරමුණ වේ.

අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු පහත සඳහන් වේ.

* ග්‍රාමීය අංශයෙහි රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා උපාය මාර්ගයක් ලෙස ගිවිසි ගොවිතැනෙහි අනාගත විභවතාවයන් විමර්ෂණය කිරීම.

* ගිවිසි ගොවිතැන ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින එක් එක් හවුල්කරුවා මුහුණ දෙන ප්‍රශ්න හා ලබාගත් ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.

* වැවිලි නොවන කෘෂිකර්මයෙහි විකිණිය හැකි නිෂ්පාදන සඳහා වෙළඳපොළ හා මිල අවධානම අවම කිරීමට ගිවිසුම් සකස් කිරීම වර්ධනය කිරීම පිණිස ගොවීන් හා වෙනත් පෞද්ගලික අංශයේ සහභාගීවන්නන් දිරි ගැන්වීමට පිළියම් උපාය මාර්ග යෝජනා කිරීම.

2000 වසර තුළදී ඇති වූ ප්‍රගතිය පහත පරිදිය

* විෂය පිළිබඳව සවිස්තරාත්මක ග්‍රන්ථයක් සම්පූර්ණ කිරීම.
* පෞද්ගලික අංශයේ ආයෝජකයන්, සුපිරි වෙළඳ සැල්, ගොවියන් භාවිතා කරන්නන් සහ අනෙකුත් සහභාගීවන්න සමඟ සංවිධාන ගතවීම.
* අපනයනකරුවන් සමඟ කෘෂි නිෂ්පාදන නිර්යාත කිරීමට ඇති විභවතාවයන් පිළිබඳ මූලික සාකච්ඡා පැවැත්වීම.

## 5. ආහාර සුරක්ෂිතතාව සඳහා ජලපාලන අංශයේ විශේෂ වැඩ සටහන ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ආහාර සුරක්ෂිතතා යෝජනාවලිය

පර්යේෂකයෝ - එස්. ධර්මලිංගම් මෙණෙවිය - සම්බන්ධීකාරක
රේණුකා වීරක්කොඩි මහත්මිය
එස්.එම්.ඒ. සමරකෝන් මහතා

නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධව නැගෙන හඬත් සමඟම ශ්‍රී ලංකාවේ ආහාර ආරක්ෂණ ගැටළු පිළිබඳ උනන්දුව අළුත් වන්නට පටන් ගෙන ඇත. එමෙන්ම පුරෝකථනය කරන ලද ලෝක ජල ඌනතාවය ද අපගේ කෘෂිකර්මය කෙරෙහි බලපානු ඇත. ජාතික මට්ටමින් හා පවුල් මට්ටමින් යන දෙයාකාරයෙන්ම ආහාර ආරක්ෂණය පිළිබඳව අතිමහත් උනන්දුවකින් යුක්ත විය යුත්තේ රටෙහි කුටුම්භයන් අධික්ම ග්‍රාමීය දුප්පතුන් වීම නිසාය. මේ හේතු කොට දැනට පවත්නා සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම අත්‍යාවශ්‍යය.

ජල පාලනය ශ්‍රී ලංකාවේ ආහාර සංරක්ෂණය කෙරෙහි සුවිශේෂී ලෙස බලපානු ඇත. වර්තමාන අස්වනු නෙළීමේ ක්‍රමයන් වෙනස් කිරීම කෙරෙහි ද එය බලපානු ඇත. ජලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම ඉහළ නැංවීමෙන් හා ගොවීන්ගේ තාක්ෂණික ඥානය ඉහළ දැමීමෙන් මෙය පහසු වනු ඇත. නියමු ව්‍යාපෘතියක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොම්බුව සහ අඹකොළවැව යන ප්‍රදේශවල මෙය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. මෙමඟින් තෝරාගත් වැඩ බිම් 20 ක ජල පාලනය හා ජල කළමනාකරණ නීති වැඩි දියුණු කෙරේ. මෙලෙස ජලය උපරිම ලෙස භාවිතයට ගැනීමෙන් වී අස්වනුවල හා වෙනත් ක්ෂේත්‍ර භෝගවල ඉහළ ඵලදායිතාවක් අපේක්ෂා කෙරේ. මීට අතිරේකව මෙම ව්‍යාපෘතිය මාර්ගෝපදේශකත්වයට හා තක්සේරුවට භාජනය වේ. එමෙන්ම මෙම නියමු ව්‍යාපෘතිය දේශීය හා කලාපීය සංවර්ධන වැඩසටහන්වලදී ආදර්ශනයක් ලෙස භාවිතයට ගැනේ.

මෙම අධ්‍යයන තුන ක්‍රියාවෙහි යොදවන නියෝජිතයා වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ක්‍රියාවෙහි යොදවන ලෙස ඉල්ලීමක් කර තිබේ.

මෙම අධ්‍යයන තුන වන්නේ කන්නය ආරම්භයේදී සිදුකළ මූලික අධ්‍යයනය කන්නය මැද කරන ලද අධ්‍යයනය සහ අවසානයේදී සිදු කරන ලද අධ්‍යයනයයි.

2000 හා 2001 මහ කන්නවලදී ආරම්භ කරන ලද වැඩසටහන 2000/2001 සහ 2002 යන කන්න තුන පුරාම ක්‍රියාත්මක වේ.

PRA සහ RRA මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිරෝධක විශ්ලේෂණය කිරීම සිදු කෙරේ. වසර 2000 දී සමාජ ආර්ථික මූලික සමීක්ෂණය නිම කරන ලදී.

### අනෙකුත් ක්‍රියාකාරකම්

කෘෂි සම්පත් කළමනාකරණ අංශ ප්‍රධාන ආචාර්ය ඩී. තෙන්නකෝන් බංගලිදේශයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය හා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි ග්‍රාම සංවර්ධන පිළිබඳ ජාතික ආයතනය සංවිධානය කරන ලද 2000 නොවැම්බර් 20 සහ 23 දිනවල හයිද්‍රාබාද් හි පැවති සර්ඩැප් සාමාජික රටවල දිළිඳුභාවය අවම කිරීමේ උපාය මාර්ග හා වැඩ සටහන පිළිබඳ කලාපීය වැඩ මුළුවට "ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය අවම කිරීමේ උපාය මාර්ග හා වැඩසටහන් යනුවෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

මුදල් සහ සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අයත් මහා භාණ්ඩාගාරයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙකු ලෙස 1990 දෙසැම්බර් සිට ආචාර්ය සෝමරත්න කටයුතු කළේය.

**ආචාර්ය ඩබ්ලිව්.ජී. සෝමරත්න**

1999 මැයි 31 දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය පැවැත්වූ සප්තා ගිවිසුමේ ආහාර බෝග ක්ෂේත්‍රයට වන බලපෑම නම් වැඩ මුළුවේදී සප්තා ගිවිසුමෙන් "ශ්‍රී ලංකාවේ වැවිලි නොවන කෘෂිකාර්මික ක්ෂේත්‍රයට වන බලපෑම" නම් පත්‍රිකාව ඉදිරිපත් කළේය.

2000 වර්ෂයේදී නාවල විවෘත විශ්ව විද්‍යාලීය, සමාජීය අධ්‍යයන අංශය සඳහා පාරිසරික ආර්ථික හා කළමනාකරණයට පාරිසරික ඇගයීම් නම් පරිච්ඡේදය සැපයීය.

2000 වර්ෂයේදී නාවල විවෘත විශ්ව විද්‍යාලීය, සමාජීය අධ්‍යයන අංශය සඳහා "පාරිසරික ආර්ථික හා කළමනාකරණයට, පාරිසරික ඇගයීම් ක්‍රම වක්‍රීය පිවිසුම්" නම් පරිච්ඡේදය සැපයීය.

2000 වර්ෂයේදී නාවල විවෘත විශ්ව විද්‍යාලීය, සමාජීය අධ්‍යයන අංශය සඳහා "පාරිසරික ආර්ථික හා කළමනාකරණයට, පාරිසරික ඇගයීම් ක්‍රම - පිවිසුම්" නම් පරිච්ඡේදය සැපයීය.

2000 වර්ෂයේදී නාවල විවෘත විශ්ව විද්‍යාලීය, සමාජීය විද්‍යා අංශයේ පාරිසරික ආර්ථික කළමනාකරණ අංශය සඳහා "පාරිසරික පිරිවැය ප්‍රතිසාධනය, විශ්ලේෂණය නම් පරිච්ඡේදය සැපයීය.

2000 වර්ෂයේදී නාවල විවෘත විශ්ව විද්‍යාලීය පාරිසරික ආර්ථික, පාරිසරික කළමනාකරණ අංශයට, "පාරිසරික සහ ස්වාභාවික සම්පත් ගණකාධිකරණය" නම් පරිච්ඡේදය සැපයීය.

"ශ්‍රී ලංකා වෙළඳ හරිතකරණය: වැවිලි නොවන කෘෂිකාර්මික සහ කෘෂි පාරිසරය තීරුබද්ද අය කිරීම නිදහස් කිරීම" නම් ලිපිය ශ්‍රී ලංකා ජර්නල් ඔෆ් ඇග්‍රිකල්චර් ඉකොනොමික්ස් සඟරාවේ 2000, 3 වෙළුම එක කලාපය සඳහාත් ශ්‍රී ලංකා කෘෂි ආර්ථික සංගමය, කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා, 2000 සඳහාත් ඉදිරිපත් කළේය.

ශ්‍රී ලංකාවේ වැවිලි නොවන කෘෂි ආර්ථිකය : ප්‍රවනතා, ගැටළු සහ හැකියාවන් පිළිබඳ ලිපිය, ජර්නල් ඔෆ් ඇග්‍රිකල්චර් ඉකොනොමික්ස් සඟරාවේ 2000, තුන වෙළුම එක කලාපය හා ශ්‍රී ලංකා කෘෂි ආර්ථික සංගමය, කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, 2000 වර්ෂය (සම ලේඛක)

වානිජ ප්‍රතිපත්තිය සහ පරිසරය ශ්‍රී ලංකාවේ ඉඩම්වල සරුබව අවමවීම නේපාලයේ කත්මණ්ඩු නුවර දුලිකල් කඳුකර හෝටලයෙහි 2000 සැප්තැම්බර් 18-21 දක්වා පැවති රාජකීය ස්විඩින විද්‍යා ඇකඩමියෙහි පාරිසරික ආර්ථික පිළිබඳව අන්තර් ජාතික ආයතනය වන බෙයියර් ආයතනය සංවිධානය කරන ලද පර්යේෂණ සම්මන්ත්‍රණයකට ඉදිරිපත් කරන ලද පත්‍රිකාවකි.

2000 නොවැම්බර් 29 දින පාකිස්ථානයේ කරච්චි නුවර අන්තර් ජාතික සංරක්ෂණ සංගමය සංවිධානය කළ ජීව විවිධත්වය සංරක්ෂණය කිරීම නම් සම්මන්ත්‍රණයේදී "ජෛව විවිධත්වයේ දිරිදීම් හා දිරි නොදීම්" යනුවෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන සම්පත් හා පාරිසරික විද්‍යා අංශය, වන සම්පත් හා පාරිසරික අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවෙන් දෙසැම්බර් 29 සහ 30 යන දිනවලදී මහනුවර ලා කැන්සියන් හෝටලයේදී සංවිධානය කළ වන සම්පත් හා පරිසරය යන වැඩ මුළුවේදී "ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කළමනාකරණය ක්ෂුද්‍ර මට්ටමින් පාරිසරික ප්‍රතිපත්ති විකල්පයන්හි විභවතාවයන්" යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

# අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය

**කාර්ය මණ්ඩලය :**

ටී.ඒ. ධර්මරත්න - අංශ ප්‍රධාන
ආචාර්ය ඩී. ගමගේ - සංවර්ධන සමාජ විද්‍යාඥ
එල්.පී. රූපසේන - අලෙවි අර්ථ ශාස්ත්‍රඥ
ආචාර්ය අයි. තුඩාවේ මිය - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිණී
සී.පී. හතුරුසිංහ මිය - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිණී
ආර්.එම්.ආර්. බණ්ඩාර මයා - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ටී. රවිචන්ද්‍රන් මයා - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ඩබ්.ඩී. වික්‍රමසිංහ මිය - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිණී (අධ්‍යයන නිවාඩු)
ටී.ජී. සෝමරත්න - සංඛ්‍යාන නිලධාරී
එස්. සේනානායක මිය - සංඛ්‍යාන නිලධාරිණී
එන්.ඩබ්. නවරත්න මයා - සංඛ්‍යාන නිලධාරී

ආයතනයේ අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය 1979 දී පාර්ලිමේන්තු පණතක් මගින් ආහාර හා වානිජ අමාත්‍යාංශයේ ජීවන වියදම් විමර්ශන කමිටුවට අලෙවි තොරතුරු ලබා දෙනු පිණිස පිහිටුවන ලදී. පසුව මෙම කමිටුවේ අර්ථය ජාතික ආහාර ආරක්ෂණ කමිටුව යනුවෙන් පුළුල් කරන ලදී. පසුගිය ඔක්තෝබර් දක්වා මෙම කමිටුව අභ්‍යන්තර හා බාහිර වෙළෙඳ, වානිජ හා ආහාර අමාත්‍යාංශයට අයත්විය. අනතුරුව එය ආහාර හා අලවි සංවර්ධන අමාත්‍යාංශය භාරයට පත්විය.

2000 වසරේ දී අංශ කාර්ය මණ්ඩලය නියුතු වූ වැඩසටහන් පහත පළවේ.

**දෛනික වැඩසටහන්**

අලෙවි තොරතුරු හා ආහාර තොරතුරු පද්ධතිය

ජාතික ආහාර ආරක්ෂණ කමිටුවට කාලීනව නිවැරදි වෙළෙඳපොළ තොරතුරු දීම අංශයේ ප්‍රධාන වගකීම වේ. මේ සඳහා පිටකොටුව තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපොන, නුගේගොඩ, කඩවත, කිරිබත්ගොඩ, කොළඹ හා නදසන්න සිල්ලර වෙළෙඳපොළවලත්, පිටකොටුව තොග වෙළෙඳ පොළේත් තොරතුරු ලබාගන්නා ලදී. මෙයට අමතරව, දත්ත හා තොරතුරු ප්‍රාදේශීය මධ්‍යස්ථාන 20කින්ද ලබාගන්නා ලදී. කොළඹ දී මෙම තොරතුරු ලබාගැනීම සඳහා සංඛ්‍යාන සහකරුවන් 6 දෙනෙකුද, අනියම් විමර්ශකයන් 14 දෙනෙකු ද යොදවන ලදී. බාහිර ප්‍රදේශ සඳහා ද එබඳුම ක්‍රියාකාරියන් ප්‍රමාණයකගේ සේවය ලබා ගන්නා ලදී.

2000 වසර තුළදී කුරුණෑගල, නිකවැරටිය, ගල්ගමුව, හෙට්ටිපොල, දඹුල්ල, මාතලේ, අනුරාධපුරය, කැකිරාව, දෙහිඅත්තකණ්ඩිය, මාරප්පන, හඟුරන්කෙත, තිස්ස, දිවුලපිටිය, යන ප්‍රදේශ ආවරණය කරන ලදී. වසරේ අවසන් භාගයේදී සමහර ප්‍රදේශවල ක්‍රියාකාරින්ගේ තනතුරු පුරප්පාඩු වී තිබිණ.

ප්‍රතිපත්ති සම්පාදකයන්ට, නිෂ්පාදනයන්ට හා වෙළෙඳුන්ට දිනපතා සතිපතා හා මාසිකව ආහාර වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් කාලීනව ලබාදීම තුළින් අලෙවි බුද්ධි තොරතුරු පද්ධතිය වෙළෙඳපොළ විනිවිද භාවය ඇතිකරයි. ඉහත සඳහන් දත්ත හා තොරතුරු පදනම් කරගෙන රටේ ආහාර අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් සිදුකරන අතර රජය විසින් අවධානය යොමු කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්න රජය වෙත ඉදිරිපත් කෙරේ.

**පර්යේෂකයෝ**

ටී.ඒ. ධර්මරත්න මහතා
ඩී.පී. හතුරුසිංහ මිය
ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා
ටී. රවිචන්ද්‍රන් මහතා
එල්.පී. රූපසේන මහතා

**සංඛ්‍යාන නිලධාරී**

ටී.පී. සෝමරත්න මහතා
එස්. සේනානායක මහතා
එන්.ඩබ්. නවරත්න මහතා

**සංඛ්‍යාන සහායකයන්**

එන්.එස්.ජේ.කේ. නිශ්ශංක මහතා
කේ.ඒ.ආර්. පත්මසිරි මහතා
යූ.ඒ.එස්. එදුස්සූරිය මහතා
ඩී.යූ. සේනානායක මහතා
ඒ. රත්නසිරි මහතා
ඩබ්.ජී.එන්. මල්කාන්ති මිය
පී.ජී. රත්නසිරි මහතා
ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා
ජී.ඩබ්. රණතුංග මහතා
ජී.වී.එස්.බී. විජේරත්න මහතා
ජේ.සී.කේ.බී. ලයනල් මහතා
එස්.එම්.එස්. ජයරත්න මහතා

} **ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය**

**කෙරෙමින් පවතින පර්යේෂණ**

**1. මැන්ගුස්ටීන් පිළිබඳ අධ්‍යයනය**

පර්යේෂක : එල්.පී. රූපසේන මහතා

මූල්‍යාධාර ආයතනය : අපනයන සංවර්ධන මණ්ඩලය

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම අධ්‍යයනය ආයතනයට පවරන ලදී. මෙහි මූලික අරමුණු වූයේ මැංගුස්ටින් නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ දත්ත හා තොරතුරු එක්රැස්කර විශ්ලේෂණය කිරීමයි. ක්‍රම දෙකකින් දත්ත එකතු කරගත් අතර පළමු ක්‍රමය වූයේ කෘෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් මගින් මෙරටේ මැංගුස්ටින් නිෂ්පාදනය කෙරෙන දිස්ත්‍රික් හතෙහි ගස්වල ප්‍රමාණය, වයස හා නිෂ්පාදනය පිළිබඳ දත්ත ලබා ගැනීමයි. දෙවනුව, මැංගුස්ටින් බහුලව වගාකෙරෙන කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල පර්යේෂකයින් විසින් සහභාගිත්ව ගැමි පිවිසුම් සමීක්ෂණයන් සිදු කරන ලදී.

**ප්‍රධාන සොයා ගැනීම් නම් :**

1. ශ්‍රී ලංකාවේ මැංගුස්ටින් ගස් 33,000ක් තිබෙන අතර ඒවායෙහි වසරකට 11,000ක් ලැබේ. තෙත් කලාපයට වෙන්වී ඇති මෙම වගාවේ නිෂ්පාදනයෙන් සියයට 75ක් ලැබෙන්නේ කළුතර රත්නපුර හා මහනුවර දිස්ත්‍රික්ක වලිනි.
2. ගෙවතු වගාවක් වන මැංගුස්ටින්හි වගා කරන ප්‍රදේශ සීමාසහිතය. බොහෝ වගාවන්හි ඇත්තේ ගස් 5ක් හෝ ඊට අඩු ගණනකි. කෙසේ වෙතත් ග්‍රාමීය ධනපතියන් සතුව විශාල ගෙවතු ඇති නිසා ඔවුහු විශාල ප්‍රමාණයක් මෙය වගා කරති. ඉහතදී මෙම ගස් වගා කළත් දැන් එය බොහෝ

විට ස්වභාවිකව වැඩෙන ගසක් බවට පත්වී තිබේ.

3. විවිධ ස්ථානවල දේශගුණික වෙනස් වීම් නිසා එලදාවද විවිධය. අධික එලදාවක් ලැබෙන කළුතර දිස්ත්‍රික්කයේ ගසකින් ගෙඩි 1500ක් වාර්තා වූ අතර රත්නපුරයෙන් වාර්තා වූයේ ගෙඩි 500කි.

4. අලෙවි ක්‍රමය අසංවිධානාත්මක වන අතර ගොවිපොළ මට්ටමේදී එය සුළු වෙළෙඳුන් විසින් ඉටුකරනු ලැබේ. බොහෝ අවස්ථාවන්වලදී ඔවුහු ගස් බදු ගන්නා අතර ගෙඩි කඩන්නාට ශත 50ක්ද, ඉඩම් හිමිකරුට රුපියල් දෙකක්ද වශයෙන් ගෙඩියකට ලබා දෙති.

වාර්තාව මගින් පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර තිබේ.

* පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කළ යුතුය. එලදාව/තත්ත්වය හා කාලගුණය අතර සබඳතාවය හා වගා කිරීමට සුදුසු ප්‍රදේශය හඳුනා ගැනීම ගෙඩියෙහි කිරි ප්‍රමාණය අවම කිරීම, ගසෙහි ප්‍රමාණය අවම කිරීම.

* ගංගා දෙපස හා අතහැර දමා ඇති රබර් වතුවල වගාව ආරම්භ කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය.

* ලාභදායක විවිධ අදේශකයන් නිසා දේශීය වෙළෙඳ පොළ දුර්වල වී ඇති හෙයින් අපනයන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. දුර්වල හා පෙරමුණේ සිටින ව්‍යාපාරිකයන් සමඟ සබඳතා ඇති කිරීම හා අලෙවි පර්යේෂණ අංශ මගින් අලෙවි තොරතුරු ලබාදීම මේ සඳහා ක්‍රියාත්මක කලහැකි අංශ දෙකකි.

## 2. ගබඩා කර ඇති වී ඇගයීමේ සමීක්ෂණය

පර්යේෂකයෝ : එල්.පී.රූපසේන
බණ්ඩාර රත්නායක

අරමුදල් සපයන ආයතනය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ගොවියන්, වෙළෙඳුන් හා මෝල් හිමියන් සතු වී ප්‍රමාණය ගණනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණවිය. අම්පාර, අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල හා හම්බන්තොට යන බහුලව වී වගා කෙරෙන දිස්ත්‍රික්කවල මෙම සමීක්ෂණය සිදු කෙරිණ. 2000 වසර තුළදී සමීක්ෂණ 4ක් පවත්වන ලදී.

## 3. ශ්‍රී ලංකාව සඳහා ජාතික පෝෂණ ආයෝජන සැළසුම

පර්යේෂකයෝ : ආචාර්ය පී.අයි. තුඩාව (සම්බන්ධීකාරක)
මහාචාර්ය ටී.ඩබ්. වික්‍රමනායක (උපදේශක)

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන ලද මෙම අධ්‍යයනයේ දී ආයතනය වොෂින්ටන් හි අන්තර් ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමඟ ඒකාබද්ධව කටයුතු කරන ලදී. 1999 දෙසැම්බර් මාසයේදී එය ආරම්භ කළ අතර 2000 මැයි මාසයේ දී අවසන් කරන ලදී.

රටේ විවිධ කොටස්වල පෝෂණ ප්‍රශ්න මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කෙරෙනු ඇත. නිදසුනක් ලෙස ආහාරවල ගුණාත්මක භාවය අඩුවීම නිසා සීඝ්‍රයෙන් රටේ පිරිවැය වැඩිවීම පැථුල ලෙස විමසීමට භාජනය වනු ඇත. පෝෂණ ප්‍රශ්න හඳුනා ගැනීමත් සමඟම විකල්ප ප්‍රතිපත්තීන් හා නිර්දේශයන් ඉදිරිපත් කෙරෙනු ඇත.

1. "වී හා සහල්වල දේශීය අලෙවි රටාව" කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2000 වසරේ දෙසැම්බර් 14-15 සහල් පිළිබඳ සම්මන්ත්‍රණයට පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

2. කෘෂිකාර්මික අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය ඉදිරිපත්කළ අධ්‍යයන යෝජනාවකි. එය 2000 වසරේ ජූලි මාසයේ JICA ආධාර සඳහාය.

3. 2000 වසරේ ගතවූ හයමස සඳහා ආහාර භෝගවල මිල ප්‍රතිපෝෂණය - කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයට ජූනි මාසයේ දී ඉදිරිපත් කළ පත්‍රිකාවකි.

4. ශ්‍රී ලංකාවේ සහල් අවශ්‍යතා තක්සේරු කිරීම කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයට ජූනිමස ඉදිරිපත් කළ පත්‍රිකාවකි.

5. ආහාර සුරක්ෂිතභාවය - ජනවාරි මාසයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සංවිධානය කළ පුහුණු වැඩසටහන් දෙකකදී කළ දේශනය

6. වී මිල ගණන් විමර්ශනය - හෙක්ටර් කොබ්බෑකඩුව අනුස්මරණ ග්‍රන්ථයට සම්පාදිත ලිපිය

7. "මධ්‍යම හා උතුරු මැද පළාත් සංවර්ධනය සඳහා කාලීන පොලවල්වල වැදගත්කම ඇගයීම" මාර්තු මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

8. "වසර 2000 මුල්මාස 6 වී /සහල් අලෙවිය විමර්ශනය" - කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය ජූලි මාසයේදී පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

9. "කෘෂිකර්ම අලෙවිකරණය" - ආයතනය නොවැම්බර් මාසයේදී පත්වන ලද ගොවි සංවිධාන වල ව්‍යාපාරික කටයුතු සංවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාවේදී කළ දේශනය.

10. වසර තුළදී කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය අලෙවිය හා සැපයුම පිළිබඳ අනුකමිටුවේ ආයතන නියෝජිතයා ලෙස සහභාගි විය.

11. වැවිලි කර්මාන්ත කළමනාකරණ ආයතනය සංවිධාන කළ ඩිප්ලෝමා පාඨමාලාවේ අපේක්ෂකයන් දෙදෙනකුගේ නිබන්ධනයන් සැකසීමේදී සුපරීක්ෂක ලෙස මාර්තු සිට ජූලි දක්වා කටයුතු කළේය.

**ටී.ඒ. ධර්මරත්න මහතා**

1. "1999/2000 වසරේ දී මහකන්නයේ වී මිල පහත වැටීම" - ආහාර සුරක්ෂිතතා කමිටුවට ජනවාරි මාසයේදී පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

2. "අම්බලන්තොට සහල් නිෂ්පාදනයේදී කැබලිවීම" නියෝජ්‍ය ඇමතිවරයාට වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

**සී.පී. හතුරුසිංහ මිය**

1. සැප්තැම්බර් මස සිට ආහාර සුරක්ෂිතතා කමිටුවේ සතිපතා රැස්වීමට සහභිගි වූවාය.

2. ආහාර සුරක්ෂිතතා කමිටුව සඳහා ආනයනික අර්තාපල් පිළිබඳ ආන්තික විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලදී.

3. සියළු ප්‍රධාන ආහාර භෝගවල මිල විශ්ලේෂණය ආරම්භ කිරීම.

**ආචාර්ය සී. ගමගේ**

1. හේග් නුවර සමාජ අධ්‍යයන ආයතනය සංවිධානය කළ නොවැම්බර් මාසයේදී ඉන්දියාවේ හයිද්‍රාබාද් පැවැත්වූන දේශපාලන ප්‍රතිසංවිධාන සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකා දල දේශපාලනයේ **දේශපාලන හා සමාජ ආරක්ෂාව** යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

2. සැප්තැම්බර් 7-8 දිනයන්හි රුහුණු විශ්ව විද්‍යාලයේ පැවැති කලාපීය හා ප්‍රජා සැළසුම් අධ්‍යාපනික දෙවැනි වැඩමුළුවේදී ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුභාවය : ස්වභාවය හා තුරන්කිරීමේ උපාය මාර්ග නම් පත්‍රිකාව ඉදිරිපත් කළේය.

3. සැප්තැම්බර් 21-22 දිනයන්හි ආයතනයේ දී පැවැති පාරිසරික අධ්‍යාපනය හා පුහුණුව වැඩ මුළුවේදී පාරිසරික අධ්‍යාපනය හා පර්යේෂණ පිළිබඳ ආයතනයේ කාර්ය භාරය යන දේශනය පැවැත්වීය.

4. සැළසුම් ක්‍රියාත්මක කිරීමේ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන හා ප්‍රගති විමර්ශන අංශයේ සංවිධානයෙන් ටාජ් සමුද්‍රා හෝටලයේදී ජනවාරි 14 -15 දිනයන්හි පැවැති ආහාර හා පෝෂණ සැලසුම් කලාපීය පුහුණු වැඩමුළුවේ පාර්ශවකරුවන්ගේ රැස්වීමට සහභාගි විය.

5. පෙබරවාරි 16 වැනි දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ සංවිධානය කළ ප්‍රතිඵල පදනම් කරගත් ප්‍රගති සමාලෝචන හා ඇගයීම් පද්ධති වැඩමුළුවට සහභාගි විය.

6 උඩවලව ව්‍යාප්ති ව්‍යාපෘතියේ ආහාර ආධාර අවශ්‍යතාවයන් ඇගයීමට ආහාර හා කෘෂිකර්ම සංවිධානයට ආධාර විය.

**ටී. රවිචන්ද්‍රන් මයා**

* සම පර්යේෂකයෙකු ලෙස අලෙවි බුද්ධි හා ආහාර තොරතුරු ප්‍රගති සමාලෝචනයට සහභාගිවිය.
* ආහාර තොග තත්ත්වය පරීක්ෂා කිරීම
* කෘෂි වෙළෙඳ ද්‍රව්‍ය විමර්ශනය 2000 සම පර්යේෂක
* ගොවි සංවිධාන සඳහා කෘෂි අලෙවිය හා ව්‍යාපාර සංවර්ධනය නොවැම්බර් 25 තිරප්පනේ සම්පත් දායකයෙකු ලෙස සහභාගි විය.

1. ආයතනයේ ශ්‍රී ලංකා ජර්නල් ඔෆ් ඇග්‍රේරියන් ස්ටඩීස් සඟරාවට ශ්‍රී ලංකාවේ තෝරාගත් එළවළු සඳහා කාර්යශීලී අලෙවි ක්‍රමයක් යන පර්යේෂණ ලිපිය සකස් කළේය. මෙය 2000 වසරේදී පළවීමට නියමිතය.

2. "ශ්‍රී ලංකාවේ බුලත් නිෂ්පාදනය හා අලෙවිය" කමනලම් (දෙමල) මාර්තු - ජූනි

3. මැයි 12 වැනි දින ලුනුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පොල් වගාවේ අතුරු භෝගයක් ලෙස අන්නාසි වගාව පිළිබඳ සම්මන්ත්‍රණයේදී අන්නාසි අලෙවිය : විභවතාවයන් හා සංඝටකයන් යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

**ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා**

1. අම්බලන්තොට ප්‍රදේශයේ වී/සහල් සැකසුම් ප්‍රශ්න (99/2000 මහ) යන මැයෙන් - අප්‍රේල් මාසයේදී කෘෂිකර්ම හා ඉඩම් නියෝජ්‍ය ඇමතිවරයාට භාර දෙන ලදී.

2. මහ ඉලුප්පල්ලම මහවැලි ප්‍රජා ගුවන්විදුලි මධ්‍යස්ථානයේදී පෙබරවාරි මස 11 සිට 13 දක්වා දිනවල ආයතනයේ සංඛ්‍යාන සහකරුවන්ට "මාධ්‍ය මගින් අලෙවි තොරතුරු ප්‍රචාරණය කිරීමේ" පුහුණු වැඩසටහන සංවිධාන කර මෙහෙයවීය.

3. ආයතනය විසින් ජූලි 8 වැනි දින සංවිධාන කළ කෘෂිකාර්මික අලෙවිකරණය සම්බන්ධ අලෙවි කමිටුවේ පුහුණු වැටසටහනේ දී කණ්ඩායම් ගතිකත්වය මාතෘකාව යටතේ දේශණයක් පැවැත්වීය.

4. තිරප්පනේ සමෘද්ධි කළමනාකාර කාර්යාලයේදී නොවැ. 28 සිට දෙසැ.22 දක්වා ගොවි සංවිධාන වල ව්‍යාපාරික සංවර්ධන පිළිබඳ පුහුණු වැඩසටහන සංවිධානය කර පැවැත්වීය.

5. ආයතනය සැප්තැම්බර් 6 හා 7 දිනවල සංවිධාන කළ "විද්‍යුත් තැපැල හා අන්තර්ජාලය" වැඩමුළුවට සහභාගිවීය.

6. ආයතනය සැප්තැම්බර් 21 සිට 27 දක්වා පැවැත් වූ "තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා පාරිසරික අධ්‍යාපනය හා පුහුණු" වැඩ මුළුවට සහභාගිවිය.

# වාරි ජල කළමනාකරණ හා ගොවි කටයුතු සම්බන්ධතා අංශය

**කාර්ය මණ්ඩලය :**

| | | |
|---|---|---|
| ආර්.ද.ඇස්. ආරියබන්ධු මහතා | - | අංශ ප්‍රධාන |
| එම්.එච්.එම්. අහියර් මහතා | - | පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි |
| ඩී.ජී. කරුණාරත්න මහතා | - | සංඛ්‍යාන නිලධාරි |

## දනට කරගෙන යනු ලබන අධ්‍යයන

### 1. ජාතික කෘෂි ළිං වැඩ සටහනෙහි ප්‍රගති තොරතුරු වාර්තා කිරීම

පර්යේෂකයෝ : ආර්.ද.ඇස්. ආරියබන්ධු මහතා(සම්බන්ධීකාරක)
එම්.එම්.එම්. අහියර් මහතා

1998 ජූලි සිට මෙම අධ්‍යනය සිදු කෙරේ. වසර 2000 දී සුළු වාරි මාර්ග පහසුකම් මහින් වගාකරණ අතර ගොවීන්ගේ කෘෂි ළිං 90 ක් සමීක්ෂණය කරන ලදී. සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පහසුකම් මහින් ලැබී තිබූන අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග උපයෝගී කර ගන්නන් සියල්ලම ආවරණය කරමින් මෙම සමීක්ෂණය සිදුකරන ලදී. ක්ෂේත්‍ර කටයුතුවලට අමතරව මෙම කන්න තුනක අධ්‍යයනය සිදු කරන ලද්දේ අනුරාධපුර මාත වැව, කුරුණෑගල පළුකඩවල හා මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල යන ප්‍රදේශවලය. සමීක්ෂණය මාවත වැව හා ගලේවෙල කෘෂි ළිං යටතේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳව අධ්‍යයනය වාර්තා කිරීමට හා විශ්ලේෂණය කිරීමට විශාල කාලයක් ගත කරන ලදී මේ අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂි ළිං 5200ක සංගණනය කළ තොරතුරු එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම නාගලේවෙල කෘෂි ළිංවල නිෂ්පාදන ක්‍රියාකාරිත්වය සොයා ගැනිම් 2000 ජූනි මස පැවැති ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයේදී එළිදක්වන ලදී.

1999 යල කන්නයේ කුරුණෑගල කෘෂි ළිං සමීක්ෂණයේ සොයා ගැනීම්වල සංක්ෂිප්තය.

1. ඉඩම් හා ජල ඵලදායිත්වයේ විවිධත්වය නිසා බිම්ගත ජලය උපරිම අයුරින් පරිහරණය කිරීම, වගා රටාවන් හා බෝගවල ජල අවශ්‍යතා පිළිබඳව උචිත පුහුණුවක් ගොවීන්ට හා නිලධාරීන්ට ලබාදීම අවශ්‍ය වේ.

2. මාවතවැව ඉඩම් හා ජල ඵලදායිතා අගයන් නොමැතිව ජල සැපයුම වැඩිවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ උපරිම කෘෂි පලදායිතාවයක් සඳහා ජල සැපයුම පමණක් ප්‍රමාණවත් නොවන බවය.

3. පවතින ළිං පරිධිය අනුව විශාල ප්‍රමාණයක භෝග වගාවන්වල ජල හිඟය නිසා අඩු ඵලදායිතාවයක් ලැබෙන බව ගලේවෙල ලබාගත් ඉඩම් හා ජල ඵලදායිතා අගයන් පිළිබඳ දර්ශකයන්වලින් පැහැදිලි වේ.

4. භූගත ජලය අඩුවැඩි වීම් පිළිබඳ ගොවීන්ගේ අදහස් හා ළිං පිළිබඳ ප්‍රගති තොරතුරු අනුව නුදුරු අනාගතයේදී බිම්ගත ජල හිඟයකට මුහුණ දීමට සිදුවන බවට සලකුණු ලැබී තිබේ. එනිසා කෘෂි ළිං ගොඩගැනීමේ ව්‍යාපෘතිය සුදුසු ජලසම්පත් අධ්‍යයනයක් යටතේ විද්‍යාත්මක පාලන වැඩ සටහනක් මහින් සිදුකළ යුතුයැයි යෝජනා කෙරේ.

5. විවිධ වගාරටාවන් අනුව උපරිම ඉඩම් හා ජල ඵලදායිතාවයක් ලබාදෙන සුදුසුම ඉඩම් ප්‍රමාණය තීරණය කරනු පිණිස විශාල සාම්පල සහිත පර්යේෂණයන් අනාගතයේදී කළ යුතුය.

6. කුරුණෑගල කෘෂි ළිං සමීක්ෂණය අනුව ගොවීන්ගෙන් 90% ක්ට කිසිදු ජලකළමනාකරණ ක්‍රමය අනුගමනය කරනු නොලැබේ.

7. කුරුණෑගල කෘෂි ළිංවල ගැඹුර "සාමාන්‍ය" ගැඹුරට වඩා වෙනස් වේ.

8. කුරුණෑගල බොහෝ කෘෂි ළිං වලින් ගොවීන් වගාකරන්නේ අක්කරයකට අඩු ප්‍රමාණයක්ය.

9. කුඩා පරිමාණ වැව් යටතේ වගා කරන ගොවීහු වී වගාවේ ජීවය රැකීම සඳහා කෘෂි ළිං වරක් හෝ දෙවරක් උපයෝගීකර ගනිති.

10. කුරුණෑගල කෘෂි ළිං සියල්ලම පාහේ පෞද්ගලික අංශය සතුවේ.

**වෙනත් කටයුතු**

**ආර්. ද.එස්. ආරියබන්ධු මහතා**

* 2000 මාර්තු මස ඕස්ට්‍රේලියාවේ මැල්බර්න් නුවර පැවැති 10 වැනි ලෝක ජල සමුළුවට ග්‍රාමීය ශ්‍රී ලංකාවේ තිරසාර ජල සැපයුමක් සඳහා වැසි ජලය උපයෝගී කරගැනීම පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

* ග්‍රාමීය ප්‍රදේශවල ජල සුරක්ෂිතභාවය ලබා ගැනීම. අගෝස්තු මස ස්ටොක්හෝම් පැවැත් 10 ජල සමුළුවට පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

**එම්.එම්.එම්. අහියර් මහතා**

* ජලය, සනීපාරක්ෂාව හා නිරෝගීභාවය නව සහස්‍රයේ අභියෝග පිළිබඳ 26 වැනි ජල ඉංජිනේරු හා සංවර්ධන මධ්‍යස්ථාන සමුළුව බංග්ලාදේශයේ ඩකාහිදී 2000 දෙසැම්බර් 5-9 දක්වා සහභාගි විය.

* ශ්‍රී ලංකාවේ වාරි ක්‍රම දෙකක ජල බෙද හැරීමේ කටයුතු පිළිබඳ සහභාගිත්ව වාරි කළමනාකරණය පිළිබඳ ලිපියක් ශ්‍රී ලංකා ගොවි කටයුතු අධ්‍යයන සඟරාවේ විසි දෙවන වෙළුමේ 1 සහ 2 කලාපවල පළ කනරන්නට යෙදුණි.

# සංඛ්‍යාලේඛන හා දත්ත සැකසුම් අංශය

**කාර්ය මණ්ඩලය :**

| | | |
|---|---|---|
| ජී.ඇම්. හේනේගෙදර මහතා | - | අංශ ප්‍රධාන |
| කේ.ඩී.එස්. ආරියසිංහ මහතා | - | දත්ත විශ්ලේෂක |
| ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා | - | දත්ත විශ්ලේෂක |
| එම්.ඩී.එල්. සෙනරත් මහතා | - | විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක |
| ජී.එච්. කරුණාරත්න මහතා | - | පුස්තකාලයාධිපති |
| ශ්‍රීමා කටුගම්පොල මෙණෙවිය | - | සහකාර පුස්තකාලයාධිපති |

මෙම ආයතනයේ සංඛ්‍යාලේඛන හා දත්ත සැකසුම් අංශය ඒකක තුනකින් සමන්විතය. එනම් දත්ත සංවර්ධන ඒකකය, පරිඝනක ඒකකය සහ පුස්තකාලයයි. දත්ත සංවර්ධන හා පරිඝනක ඒකක සංඛ්‍යානමය තොරතුරු සැකසීම උදෙසා එකාබද්ධව කටයුතු කරනු ලබයි. පුස්තකාලය, නාමාවලි තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරනු ලබයි. මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයන්ට, පර්යේෂකයින්ට, සැලසුම්කරුවන්ට, ගොවීන්ට හා අනෙකුත් අයට අවශ්‍ය ගොවිකටයුතු ක්ෂේත්‍රයේ තොරතුරු සැපයීමය.

## 1. දත්ත බැංකුව

### දත්ත එක්රැස් කිරීම

දත්ත බැංකුවෙහි කාර්යභාරය වනුයේ ප්‍රාථමික හා ද්විතියක මාර්ගවලින් කෘෂිකාර්මික භෝග, පශු සම්පත් හා ජීව දත්ත අලෙවිය හා නිෂ්පාදනය පිළිබඳ දත්ත පදනමක් පවත්වාගෙන යාමයි.

දත්ත බැංකුවෙහි වගා නිෂ්පාදනය, වගා බිම් ප්‍රමාණය,වගා පිරිවැය, හා ආදායම නිෂ්පාදකයාගේ භොග අලෙවිකරුගේ හා සිල්ලර වෙළෙඳමේ මිල ගණන් ව්‍යාප්ති වාරිමාර්ග සහ වෙළඳම් පිළිබඳ දත්ත මාලාවන් අඩංගු වේ. 2000 වසර තුළදී පහත සඳහන් තොරතුරු යාවත්කාලීන කරන ලදී.

1. වී/සහල්, හැරුණුවිට වෙනත් ධාන්‍ය, රණිල භෝග, අලවර්ග, තෙල් සහිත භෝග, කාර්මික භෝග, කුළුබඩු, එළවළු, පලතුරු හා වැවිලි භෝගවල බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා මිල ගණන්.

2. පාරිභෝජන එළවළු, යම් යම් අලවර්ග, පාරිභෝගික පලතුරු හා ඇට වර්ග, කෝපි, තේ හා කුළු බඩු ධාන්‍ය ආදියෙහි බාහිර වෙළඳ සංඛ්‍යාන

3. විවිධ කෘෂිකාර්මික භෝග සම්බන්ධ වගා පිරිවැය

4. වී, තේ,රබර්,පොල් අතුරු ආහාර භෝග හා අපනයන කෘෂිකර්ම භෝග පොහොර සම්බන්ධ සංඛ්‍යාන

5. පශු සම්පත් සංඛ්‍යාන

6. ද.ජා.නි, ද.දේ.නි හා කොළඹ පාරිභෝගික මිල දර්ශනය

ඉහත සඳහන් කළ ක්‍රම ජන සංඛ්‍යාන හා ජීව දත්ත සංඛ්‍යානවලට අමතරව වන සම්පත් හා ධීවර අංශවලට අයත් දත්තද එක්රැස්කර යාවත්කාලීන කර තිබේ. වසර තුළදී දත්ත 62,431 ක් වාර්තාගත කළ අතර දත්ත 63,625ක් පරිඝනකයට ඇතුළත් කර ඇත.

ද්විතීයක දත්ත මූලයන් සේ පහත සඳහන් ප්‍රකාශන උපයෝගි කරගන්නා ලදී.

1. කෘෂිභෝගවල වගා පිරිවැය (1995/96) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා
3. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාව
4. විදේශ වෙළඳම් සංඛ්‍යාලේඛන (1996-97) රේගු දෙපාර්තමේන්තුව
5. සංඛ්‍යාලේඛන උපුටනයන් (1996) - ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
6. වැවිලි ක්ෂේත්‍රයෙහි සංඛ්‍යා ලේඛන අත්පොත (1997) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
7. ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය - ත්‍රෛමාසික වාර්තා, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
8. පොහොර විමර්ශනය (1998). ජාතික පොහොර ලේකම් කාර්යාලය.
9. ධීවර වාර්ෂික දින පොත - (1996-99)
10. ශ්‍රී ලංකාවේ පුරන් වී ගිය කුඹුරු ප්‍රමාණය (1997/98)

ආහාර සුරක්ෂිතතාවය, ඖෂධ පැලෑටි හා සාම්ප්‍රදයික ආහාර භෝග පිළිබඳ මූලික දත්ත ලබා ගැනීමේ අරමුණින් ක්ෂුද්‍ර සමීක්ෂණ පවත්වන ලදී. (අරළු,බුළු,නෙල්ලි වැනි) සම්ප්‍රදායික ආහාර භෝග පිළිබඳව මොණරාගල දිස්ත්‍රික්කයේත් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ගම්පහ බදුල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවලත් මෙම සමීක්ෂණය පවත්වන ලදී.

**දත්ත සඳහා ඉල්ලීම්**

2000 දී දත්ත බැංකුවට තොරතුරු උදෙසා ලැබුණ ඉල්ලීම් සංඛ්‍යාව 70 ක් විය. ආයතනයේ හා බාහිර වූ ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව පිළිවෙලින් 24 ක් සහ 46ක් විය. 1999 දී ඊට කලින් වසර හා සංසන්දනය කර බලන කළ දත්ත සඳහා ඉල්ලීම් සංඛ්‍යාව පහත වැටී තිබුනි.

**දත්ත සඳහා ඉල්ලීම් පහත සඳහන් ලෙස වර්ගකළ හැකිය.**

| **වර්ගය** | **සංඛ්‍යාව** | **%** |
|---|---|---|
| ආයතනයේ ඉල්ලීම් | 24 | 34.3 |
| අමාත්‍යාංශය/රජයේ දෙපාර්තමේන්තු සංස්ථා යනාදිය | 14 | 20.0 |
| පෞද්ගලික සමාගම් | 01 | 1.4 |
| ජාත්‍යන්තර සංවිධාන/තානාපති කාර්යාල | 05 | 7.1 |
| පර්යේෂණ ආයතන | 06 | 8.6 |
| විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය/ශිෂ්‍යයින් | 18 | 25.7 |
| බැංකු | 01 | 1.4 |
| පෞද්ගලික අය | 01 | 1.4 |
| එකතුව | 70 | 100.0 |

බාහිරව භාවිතා කරන්නන්ගෙන් දර්ශක උදෙසා ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව 1625 ක්වූ අතර, අවශ්‍යවූ සියළුම දත්තවලින් දත්ත දර්ශක 19 බැංකුවේ නොතිබුනි.

බාහිර භාවිතාකරන්නන්ට දත්ත සැපයීමෙන් ලත්මුළු ආදයම 2000 දී රු.640.50 ක් විය. පසුගිය වසර හා සැසඳීමේදී මෙය පසුබෑමක් පෙන්නුම් කරයි.

### නිම කළ අධ්‍යයන

### 1. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය විවරණය (ඉංග්‍රීසි)

පර්යේෂකයෝ : ජී.එම්. හේනේගෙදර මහතා - සම්බන්ධීකරන
එල්.පී.රූපසේන මහතා
ටී. රවිචන්ද්‍රන් මහතා
එම්.එස්. සේනානායක මහතා
එම්.එම්.එම්. අහියර් මහතා

ජනාධිපති කාර්ය සාධක බලකාය තෝරාගන්නා ලද එළවළු වර්ග 6ක හා පලතුරු වර්ග 6ක ප්‍රවණතා හා විභවතා විමර්ශනය කිරීම සඳහා වෙළෙඳ ද්‍රව්‍ය පැතිකඩක් සේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය විවරණය (1999) සකස් කරන ලදී. පතෝල කරවිල, නෝකෝල්, බීට්රූට්, පිපිඤ්ඤා, මාළු මිරිස්, පැෂන් ෆෘට්, පැපොල්, මැංගුස්ටීන්, රඹුටං, දිවුල් හා අලිපේර පිළිබඳ තොරතුරු එයට ඇතුළත් වේ. මෙම භෝග වගාකිරීමේදී ඇතිවන පරතරය, සංරෝධක හා විභවතාවයන් මෙම අධ්‍යයනය මඟින් සොයාගෙන ඇති අතර, ඒ සඳහා උචිත ප්‍රතිපත්ති නිර්දේශයන්ද ඉදිරි පත්කර ඇත.

### 2. තිරසර වැසිදිය කෘෂිකාර්මික ක්‍රමයක් තුළින් කුටුම්භ ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම.

පර්යේෂකයෝ : පී. වික්‍රමාරච්චි මහතා
ජී.එම්. හේනේගෙදර මහතා
එම්.එම්.එම්. අහියර් මහතා

තෙත්, අතරමැදි හා වියලි කාලපීය ප්‍රදේශවල වැව් දියෙන් වගා කරන ගොවීන්ගේ කුටුම්භ මට්ටමේ ආහාර සුරක්ෂිතතාවයේ මට්ටම් විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. හේන් හා කුඹුරු ගොවිතැනෙහි අස්ථිරභාවය හා අව නිෂ්පාදන විභවතාවයන් ඇති බව මෙම අධ්‍යයනයෙන් හෙළිවූ කරුණු වේ. ක්‍රියාශීලී හා තිරසාර ක්‍රමයන් ඇති කිරීම සඳහා යැපුම් මට්ටමේ වැසි දිය ගොවිතැන් ක්‍රමය වෙනස් කිරීම සඳහා නිර්දේශයන් රැසක් මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කර ඇත.

### පරිඝනක ඒකකය

මෙම අංශයේ පරිඝනක ඒකකය දත්ත සැකසීම සහ විශ්ලේෂණය උදෙසා පහසුකම් සපයයි. ඒ උදෙසා පහත සඳහන් කටයුතුවල නිරතවේ.

* දත්ත විශ්ලේෂණය
* පද්ධති සංවර්ධනය

### දත්ත විශ්ලේෂණය

මෘදුකාංග උපයෝගි කරගෙන මෙම අංශයේ පරිඝනක ඒකකය මඟින් සමීක්ෂණවල ක්ෂේත්‍ර තොරතුරු විශ්ලේෂණය කරන ලදී. වසර තුළදී පහත සඳහන් අධ්‍යයන පරිඝනක ගත කරන ලදී.

1 තිරසාර වැසිදිය කෘෂිකාර්මික ක්‍රමය තුළින් කුටුම්භ මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම.

2 කෘෂිකාර්මික වෙළෙඳ ද්‍රව්‍ය විවරණය - 1998.

3 ගම්පහ දිස්ත්‍රික්කයේ කොස්ගස් සමීක්ෂණය හා එළදෙව පිළිබඳ සමීක්ෂණය.

4 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආ.කෘ.ස. ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ප්‍රගති සමාලෝචනය හා ඇගයීම් අධ්‍යයනය.

### පරිඝනක ගතකළ දත්ත

මෙය ශ්‍රී ලංකාවේ ආයතන හැටක් පමණ එක්රැස් කළ සමාජ-ආර්ථික දත්ත පවත්වා ගැනීමට සංවර්ධනය කළ ගබඩා කිරීම් සහ ආපසු ලබාගැනීමේ පද්ධතියකි. 50,000 ක එකතුවකින් යුත් වාර්තා ප්‍රමාණයක් මෙයට ඇතුලත් කර ඇත. බාහිර හා අභ්‍යන්තර දත්ත ඉල්ලීම් 70ක් වසර තුළදී ලැබිණ. ප්‍රස්ථාර වශයෙන් හා සාමාන්‍ය දත්ත වගු ලෙස ඒවා ලබා දීමට දත්ත බැංකුවට හැකිවිය.

තවද පරිඝනක ඒකකය අතිකුත් අංශවල මෘදුකාංග හා දෘඩාංගවල ගැටළු විසඳලීමටද අවශ්‍ය සහය ලබාදෙයි. ආයතනයේ වැටූප් සකස් කිරීමේ කටයුතු ද පරිඝනක ගත කිරීමට මෙම අංශය කටයුතු කර ඇත.

**පුස්තකාලය**

පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම ආයතනයේ පර්යේෂකයින්, වෙනත් ඒ පිළිබඳව උනන්දුවක් ගන්නා පුද්ගලයින් හා ආයතන උදෙසා ගොවිකටයුතු ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු එකතුකර, සුදුසු පරිදි සකස්කර ප්‍රචාරණය කිරීමයි. වසර තුළදී කාර්ය මණ්ඩලය පොත් 1080ක්ද, සඟරා කලාප 782ක්ද ලබාගෙන තිබුණි.

**පොත්, සඟරා හා වාර්තා ලබාගැනීම**

වසර තුළදී පුස්තකාලය ලබාගත් පොත් සංඛ්‍යාව 392 කි. මෙයින් 152 සෘජුවම මිලදීගත් ඒවාය. අනෙකුත් 234 හුවමාරු පදනම මත හෝ තිළින පදනම මත ලබාගත් ඒවාය. එමෙන්ම වාර ප්‍රකාශන, ප්‍රවෘත්ති හසුන්, වාර්ෂික වාර්තා විශාල සංඛ්‍යාවක් විදේශීය හා දේශීය ආයතනවලින් තිළින හෝ හුවමාරු පදනමක් මත ලැබිණි. පුස්තකාලය විදේශීය සඟරා 37කට ද දේශීය සඟරා 24කට ද දායකත්වය ලබා ගෙන ඇත.

**අන්තර් පුස්තකාල සහයෝගිතාවය**

ඇග්‍රිනෙට් එස්.ඩී.සී.පී. වැඩසටහනට පුස්තකාලය මෙම වසරේ දී ද සහභාගි විය. වසර තුළදී පුස්තකාලය විසින් සඟරා 20 ක පටුන 202 ක් යැවූ අතර සඟරා 20ක පටුන 202 ක් එම සේවයෙන් ලැබිණ.

අන්තර් පුස්තකාල ණය පදනම යටතේ පොත් 51 කට හා සඟරාලිපි 41 කට ඉල්ලීම් ලැබිණ. මෙම ක්‍රමය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන්ට පොත්පත් නිකුත් කෙරිණ.

කාෆ් පුස්තකාලයෙහි ඇති ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලී පදනමට තොරතුරු ලබාදෙන ලදී. එම දත්ත පදනමේ මුද්‍රිත විද්‍යුත් පිටපත් 3 ක් පුස්තකාලය සතුව ඇත. කාෆ් පුස්තකාලය පවත්වාගෙන යනු ලබන (1993 -97 දක්වා පළකරන ලද සඟරා 140 පූර්ණ ලේඛනවලින් සමන්විත) ඊමේල් විද්‍යුත් පුස්තකාලය පරිහරණය කිරීමේ පහසුකම්ද පර්යේෂකයන්ට ලබාදෙන ලදී.

පුවත් පත්‍ර ලබාදීම මගින් ජාතික පුස්තකාලය පවත්වාගෙන යනු ලබන ජාතික පුවත් එකතුවට ද පුස්තකාලය දායකවිය. එහි මුද්‍රිත වෙළුම් තුනක් පුස්තකාලයට ලැබී ඇත. මෙම වසර තුළදී පුස්තකාලය මගින් විද්‍යුත් තැපැල් පහසුකම් ලබාදෙන ලදී.

**වෙනත් කටයුතු**

**අන්තර් ජාලය පිළිබඳ පරිශීලන වැඩමුළුව**

බංග්ලාදේශයේ ආසියා හා පැසිපික් කලාපීය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථාන හා සම්බන්ධිතව, මෙම වැඩමුළුව පවත්වන ලදී. පර්යේෂකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ මෙරටෙහි ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවන්නන් අතර තොරතුරු තාක්ෂණික දැනුම වර්ධනය කිරීම එහි අරමුණ විය. ආයතන සම්මන්ත්‍රණ ශාලාවේදී සැප්තැම්බර් 6 හා 7 දිනවල වැඩමුළුව පැවැත්වූන අතර විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන සංවිධානවල පුද්ගලයන් 20ක් පමණ එයට සහභාගි වූහ.

## පුහුණු අංශය

මෙම අංශය පුහුණු හා ප්‍රකාශන ඒකකවලින් සමන්විතය.

**කාර්ය මණ්ඩලය**

ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා - අංශ ප්‍රධාන
අයි.ආර්.පෙරේරා මහතා - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ජී. පියරත්න මහතා - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
එම්.ජී.එම්. රසාක් මහතා - පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී (වැටුප් රහිත නිවාඩු)
එන්.එස්.බී. ඇපාකන්ද මහතා - සංඛ්‍යාන නිලධාරී

පුහුණු ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ආයතනයේ පුහුණු වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීමය. මෙම ආයතනයේ පුහුණු වැඩසටහන් කෙටි පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණවලින් සමන්විතය. මෙම වැඩසටහන් උදෙසා සම්පත්දායකයින් ප්‍රධාන වශයෙන් ලබාගන්නේ ආයතනයේ පර්යේෂණ අංශවලිනි. මෙයට අමතරව විශේෂිත අවශ්‍යතා උදෙසා ආයතනයෙන් බාහිරව විශ්ව විද්‍යාල, වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතනවලින් සම්පත්ලාභීන්ගේ සෙවය ලබා ගැනේ. එයට අමතරව අදාළ රාජ්‍ය ආයතනවලට හා රාජ්‍ය නොවන ආයතනවලටද ආයතන මඟින් සම්පත්ලාභීන් ලබාදෙනු ලැබේ. තවද මෙම ඒකකය පුහුණුව ඒකාබද්ධව පවතින ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිද භාරගනු ලැබේ.

### නිමකළ වැඩමුළු හා පුහුණු වැඩසටහන්

**තිරසාර සංවර්ධනයන් සඳහා පාරිසරික අධ්‍යාපනය හා පුහුණු පිළිබඳ වැඩමුළුව**

අනාගත පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම පිළිබඳව අදහස් උදහස් හුවමාරු කර ගැනීමේ මාධ්‍යක් ලෙසද මෙම වැඩ මුළුවෙන් සේවයක් සැළසිණ. නිලධාරීන්ට හා ගොවීන්ට පරිසර අධ්‍යාපනය පිළිබඳව පුහුණුව ලබාදීම සඳහා සකස් කරන ලද්දකි.

පුහුණු කණ්ඩායම : ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා
එස්.ආර්. බණ්ඩාර මහතා
ජී. පියරත්න මහතා
එම්.එම්.එම්. අහියර් මහතා

තිරසාර සංවර්ධනයක් උදෙසා පාරිසරික අධ්‍යාපනික ආයතනික හැකියාවන් ගොඩනැඟීම මෙම වැඩමුළුවේ අරමුණ විය. සැප්තැම්බර් 21 හා 22 දිනවල එය පැවැත්විය. සම්පත්දායකයන් හතර දෙනෙකු ද නවත් 32 කුද එයට සහභාගි වූහ.

**සොයා ගැනීම් :**

එකම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන්ට පරිසරය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් මොනවාද? කෘෂිකාර්මික හා මානව සංවර්ධනයට අහිතකර ලෙස බලපාන මානව කටයුතු හා පුරුදු මඟින් ඇතිවන පාරිසරික ප්‍රශ්න අවම කිරීම සඳහා මෙම වැඩසටහන් ප්‍රයෝජනවත් වන්නේ කෙසේද? ඔවුන් විසින් පවත්වනු ලබන පාරිසරික අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සම්බන්ධයෙන් අදාල ආයතන අතර පොදු අවබෝධයක් ලබාගැනීමට ක්‍රියාකාරී සැලැස්මක් ද වැඩ මුළුව අවසානයේ දී සකස් කර ගන්නා ලදී.

**දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් සඳහා සහභාගිත්ව ගැමි පිවිසුම් පිළිබඳ පුහුණු පාඨමාලාව**

සහභාගිත්ව සැලසුම් හා කළමනාකරණ මෙවලම් කිරීමේ පුළුල් සංකල්පය හා දැනුම සහභාගිවන්නන්ට ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව සකස් කරන ලදී.

වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එගොඩකන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැති මෙම පාඨමාලාවට සැළසුම් සහකාර අධ්‍යක්‍ෂ ග්‍රාම සංවර්ධන නිලධාරී සමෘද්ධි නිලධාරී හා කළමණාකරු, කෘෂි සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්, එලදයිතා නිලධාරී ආදී විවිධ නිලතල දරණ දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් පුද්ගලයන් 32කු සහභාගි විය.

1. ව්‍යාපෘති සංවිධායක යටතේ ග්‍රාමීය ජනතාව තුළ ඇති විශ්ලේෂණය කිරීමේ හා තීරණ ගැනීමේ හැකියාව ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්ට ඒත්තු ගැන්වීම සඳහා මෙම පුහුණු වැඩ සටහන ප්‍රධාන වශයෙන් සකස් කර තිබේ. ඒ අනුව ග්‍රාමීය ජනතාව පිළිබඳව වැරදි ආකල්ප ඇතිකර ගැනීම වළකනු ඇත.

2. මෙම පුහුණු වැඩසටහනෙහි අනෙකුත් අරමුණු වන්නේ RRA සහ PRA තාක්‍ෂණයන් පිළිබඳව ග්‍රාමීය නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීමයි. එමගින් ඔවුනට ක්‍රියාකාරී සහභාගිත්ව ප්‍රවේශයක් සඳහා යොමු කළ හැකි වනු ඇත.

**පුහුණු කිරීමේ කණ්ඩායම**

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා
අයි.ආර්. පෙරේරා මහතා
ජී.එම්. හේනෙගෙදර මහතා
ඩබ්.එම්.බී. ගිරාගම මහතා
ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා
පී. පියරත්න මහතා

**සටහන :**

බොහෝ සහකාර අධ්‍යක්‍ෂවරුන්ට (සැළසුම්) ඉඩම් නිලධාරීන්ට සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරීන්ට RRA පිළිබඳව පුහුණුවක් නැත. වලපනේ නිල්දණ්ඩහින්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියතිල්ල, පතන, පලාපතාන සහ කලගන්වත්ත යන ගම්වල ගැමියන් සඳහා ව්‍යාපෘති සැළසුම් සාදන ලදී.

**උපදේශය :**

මෙම ප්‍රදේශය සඳහා ව්‍යාපාරික සැළසුම් පිළියෙල කිරීම සඳහා ව්‍යාපෘති ඇරඹීමට මූල්‍ය සහ තාක්‍ෂණ සහාය අවශ්‍යය. මග පෙන්වීම හා තක්සේරුකරණය බාහිර ආයතන මගින් කළ යුතුය.

**ගැමි සංවිධාන සඳහා**
**අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධන පුහුණුව**

ඉහත සඳහන් පුහුණු වැඩසටහනේ අරමුණු වන්නේ ගොවි සංවිධාන සහ සමෘද්ධි නියාමකයන් අතර අලෙවිකරණය යන ව්‍යාපාර සංවර්ධනයට අදළ කුසලතා සංවර්ධනය කිරීමයි. වර්ෂ 2000 දී තිරප්පනේ සහ පිරමඩුව කොට්ඨාශවල පුහුණු වැඩ සටහන් අවසන් කරන ලදී.

මෙම වැඩසටහන OHP සහ වෙනත් පුහුණු කිරීමේ උපකරණ උදව් කර ගනිමින් පැවැත්වීය. අනුරාධපුර මහ බැංකුවේ නිලධාරීන් සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන යේ තොග වෙළඳුන් සමග තව දුරටත් අත්දැකීම් බෙදගන්නා ලදී. පුළුල් පරාස දෙකක් වන අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව පුහුණු පන්ති පැවැත්විය.

**පුහුණු කණ්ඩායම**

එම්.ආර්.එම්.බී. රත්නායක මහතා
ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා

එල්.පී. රූපසේන මහතා
පී. පියරත්න මහතා
එම්.ආර්.ජී.කේ.බී. රත්නායක මහතා
ටී. රවිචන්ද්‍රන් මහතා
එස්.එම්.ඒ. සමරකෝන් මහතා

**සටහන :**

මෙම වැඩ සටහන ගොවි සංවිධාන කාර්යක්ෂම කරන ලදී. බැංකු සහ රජයේ වෙනත් ආයතන මගින් ලබා ගත හැකි මූල්‍ය සහාය සහ නව වෙළඳපොළ ක්‍රම පිළිබඳව ගොවි සාමාජිකයන් දැනුවත් විය. ප්‍රදේශයෙන් ලබාගත හැකි සම්පත් උපයෝගි කර ගනිමින් කෘෂිකර්මය පාදක කොට ගෙන කළ හැකි කර්මාන්ත පිළිබඳ ඔවුන් දැනුවත් විය.

**ක්‍රියාත්මක වැඩසටහන්**

විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඉල්ලීම මූල් කොට ගෙන පහත සඳහන් පාඨමාලා සඳහා ආයතනය පාඨමාලා උපකරණ සහ වැඩසටහන් සම්පාදනය කරමින් සිටී.

**කෘෂිකාර්මික වෙළඳ පොළ පිළිබඳ ඩිප්ලෝමාව**

එල්.පී. රූපසේන මහතා (පාඨමාලා අධ්‍යක්ෂ) ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා (පාඨමාලා සම්බන්ධීකාරක) මෙහි නිරතව සිටිති.

**කෘෂි සම්පත් කළමනාකරණය සහ සහභාගිත්ව සැලසුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

ගිරාගම මහතා (පාඨමාලා අධ්‍යක්ෂ) ආර්.එම්.ජී.කේ.බී. රත්නායක (පාඨමාලා සම්බන්ධීකාරක) ජේ .කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා සහ එම්.එම්.එම්. අහියර් මහතා (සම්පත්දායක) පාඨමාලාවට අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කිරීමේ නිරතව සිටිති.

**වෙනත් ක්‍රියාකාරකම්**

අධිකරණ ව්‍යවස්ථා කටයුතු සහ ජනවාර්ගික හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සඳහා බලය බෙදා හැරීම පිළිබඳව පුහුණු අත්පොතක් අයි.ආර්. පෙරේරා මහතා සහ රත්නායක මහතා විසින් සම්පාදනය කරන ලදී.

SSLILG හි වැඩ සටහන් සැලසුම් අවබෝධය පිළිබඳ කමිටුවේ සාමාජිකයෙකු ලෙස අයි.ආර් පෙරේරා මහතා කටයුතු කරන ලදී. අයි.ආර්. පෙරේරා මහතා සම්පත් දායකයෙකු ලෙස පුහුණු කිරීම් අභිවර්ධනය කිරීමේ වැඩමුළුවට සහභාගි විය. (දේශීය රාජ්‍ය දෙපාර්තමේන්තුව - නුවර)

අයි.ආර්. පෙරේරා මහතා ප්‍රාදේශීය ප්‍රධානින් සඳහා පුහුණු ක්‍රමවේදය පිළිබඳ පාඨමාලා දෙකක් පවත්වන ලදී.

අයි.ආර්. පෙරේරා මහතා කෘෂි සංවර්ධන අධිකාරිය සඳහා පුහුණු ක්‍රමවේදය පිළිබඳ පාඨමාලාවක් පවත්වන ලදී.

අයි.ආර්. පෙරේරා මහතා ප්‍රාදේශීය ප්‍රධානින් සඳහා වූ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පාඨමාලාවට සම්පත් දායකයෙකු ලෙස සහභාගි විය.

ගිරාගම මහතා කොළඹ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ වෙනස්කම් පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ගිරාගම මහතා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ, විද්‍ය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, විද්‍යා අධ්‍යයන ඒකකයේ කටයුතු කරන ලදී.

ගිරාගම මහතා, ශ්‍රී ලංකා ජාතික තාක්ෂණික ආධ්‍යයන ආයතනයේ, උපාධිධාරීන් සඳහා පුහුණු ක්‍රමවේදය පිළිබඳ උපාධි වැඩසටහනේ පාඨමාලා උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගි විය.

ගිරාගම මහතා 2000 අප්‍රේල් 5 වැනි දින පැවති තාක්ෂණික ක්‍රම උපදේශක කමිටුවේ ආරම්භක උත්සවයේදී ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

ගිරාගම මහතා 2000 අප්‍රේල් 6-7 පේරාදෙණිය ගන්නෝරුවේ ISTI හි පැවති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය සංවිධානය කළ ඊළඟ සහස්‍රයේ කෘෂිකාර්මාන්තය සඳහා භූමිය සහ ජලය කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි විය.

ගිරාගම මහතා 2000 අප්‍රියෙල් 25 සිට 27 දක්වා ඉන්දියාවේ, හයිද්‍රබාත්හි පැවති දකුණු ආසියානු කලාපීය ග්‍රාමීය සංවර්ධන පුහුණු වැඩසහන් නිර්මාණය සඳහා පැවති වැඩමුළුවට සහභාගි විය.

ගිරාගම මහතා 2000 නොවැම්බර් 10 සිට 13 දක්වා, ශ්‍රී ලංකා පළාත් පාලන පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කරන ලද පුහුණුකරන්නන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහනට, සම්පත්දායකයෙකු ලෙස සහභාගිවිය.

ගිරාගම මහතා 2000 නොවැම්බර් 20 සිට 24 දක්වා පැවති පාරිසරික සහ වන සම්පත් අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සංවිධානය කළ පාරිසරික කළමනාකරණ පුහුණු වැඩ සටහනට සහභාගි විය.

ගිරාගම මහතා 2000 දෙසැම්බර් 18 සිට 19 දක්වා පැවති පාරිසරික හා වන සම්පත් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද Logical Framework Approach on projeet Formulation වැඩමුළුවට සහභාගි විය.

ගිරාගම මහතා 2000 දෙසැම්බර් 20 වැනි දින කොළඹ, ට්‍රාන්ස් ඒෂියා හෝටලයේදී පැවැති "ශ්‍රී ලංකාවේ පාරිසරික පර්යේෂණ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය දීමේ ජාතික වැඩසටහන" ට සහභාගි විය.

**2000 වසර තුළදී පුහුණු කිරීමේ අංශය මගින් සංවිධානය කරනු ලැබූ ක්‍රියාකාරකම්**

| **ක්‍රියාත්මක** | **2000 වසර තුළදී අවසන් කළ** |
|---|---|
| දකුණු ආසියා කලාපය සඳහා විෂයමාලා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ ඩිප්ලෝමාව සහ සහතික පත්‍ර පාඨමාලාව | ගොවි සංවිධාන සඳහා අලෙවිකරණ හා ව්‍යාපාර සංවර්ධන පුහුණුව |
| තාක්ෂණික උපකාරක වැඩසටහන HARTI) විදේශ කටයුතු අමාත්‍යාංශය | සහභාගිත්ව ග්‍රාමීය ඇගැයීම් /කඩිනම් ග්‍රාමීය ඇගයීම් පිළිබඳ පුහුණු පාඨමාලාව |
| කෘෂිකාර්මික අලෙවිකරණ ඩිප්ලෝමාව | (PRA/RRA) දිස්ත්‍රික් හා පළාත් නිලධාරීන් සහ ගොවීන් සඳහා |
| කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය සහ සහභාගිත්ව සැලසුම් සහතිකපත්‍ර පාඨමාලාව | තිරසර සංවර්ධනය සඳහා පාරිසරික අධ්‍යන පුහුණු කිරීමේ වැඩමුළුව. |

## 2000 දෙසැම්බර් වන විට කාර්ය මණ්ඩලය

**අධ්‍යක්ෂ**

ආචාර්ය ඇස්.ජී. සමරසිංහ මහතා
බී.ඒ. (ගෞරව) ශ්‍රී ලංකා
එම්.ඒ. (පෙන්සිල්වේනියා), පී.එච්.ඩී. (කොළඹ)
එල්.එල්.බී. (විවෘත විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා)

ප්‍රධාන විෂය ක්ෂේත්‍රය

කෘෂිකර්ම සමාජ විද්‍යාව, ජනශ්‍රැති හා මානව විද්‍යාව, සාහිත්‍ය සහ කලාව

**නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)**

**පුරප්පාඩු වී ඇත.**

### කෘෂි සැලසුම් හා ඇගයීම් අංශය

